**ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම් - 2020**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ ("මණ්ඩලය") හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ("සමූහය") ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සීමාසහිත එල්.ටී.එල් (පුද්.) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදි.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- මණ්ඩලයේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණයේ යොදාගැනීම පිළිබඳ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ හා සමූහයේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය හා සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය හා සමූහය කටයුතු කර ඇති බව, සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව මණ්ඩලය හා සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------` `

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------------- | ---------------------------- | ------------------- |
| **(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව** | | |
| (i) සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, මණ්ඩලයේ නිශ්චිත ආදායම් අයිතමයන්හි පිරිවැය සහ ඉපයීම් අතර ඍජු | ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 (j) වගන්තිය මඟින් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් පිහිටුවීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇත. එබැවින් මණ්ඩලයේ සේවකයින් සඳහා අර්ථසාධක | ආයතනයට අදාළ වියදම් හඳුනා ගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රමිතියෙහි |

| | | |
|---|---|---|
| සම්බන්ධයක් නොමැති සහ වෙනම ආයතනයක පරිපාලන වියදම් වූ රු. මිලියන 43.97 ක වියදමක් මණ්ඩලය සිය ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන තිබුණි.<br>(ii) 4.3 ඡේදයට පටහැනිව, මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා නොයන සහ වත්කම්වල පාලන බලය හා අයිතිය මණ්ඩලය සතු රු. මිලියන 8 ක් වටිනා වත්කම් වෙනත් ආයතනයක් විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි. | අරමුදල පිහිටුවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකි. 2003 දෙසැම්බර් 31 වන දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීතිවල අංක 5 වගන්තියට අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් මගින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කරනු ලබයි. එබැවින් අරමුදල කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එබැවින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කිරීමේ පිරිවැය මණ්ඩලය මගින් දරනු ලබයි.<br>තවද, එම රීතිවල අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 1 දින සිට) එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත.<br>මෙම කරුණ 2021 පෙබරවාරි 11 වැනි දින පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර, එමගින් කමිටුව විසින් දැනට පවතින පරිචය දිගටම කරගෙන යාමට සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයක් ඇති කර ගැනීමට තීරණය කරන ලදි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. (2021-03-29 දිනැති යොමු අංකය: AFM(TM) / DFM (අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල) /Adm/ 2021/01) මෙම කරුණ විස්තරාත්මකව සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් දැරීමේ වත්මන් ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදි. | ප්‍රතිපාදනවල අවශ්‍යතාවලට අනුකූල වීම සහ ආයතනික අරමුණු සඳහා වත්කම් භාවිතා කිරීම. |
| (iii) වත්කමේ අයිතිය හා සම්බන්ධ ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි විය. | මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අදාල ලියකියවිලි නොමැති අතර එම නිසා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස මණ්ඩලය විසින් ඉඩම් කොමසාරිස්වරයාගෙන් ඉල්ලා ඇත. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| **(ආ) එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**<br>ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය | **ද්‍රව්‍ය පිරිවැය**<br>එල්.කේ.ඒ.එස් 2 - තොග, ඡේද අංක 25 අනුව, FIFO හෝ බරිත සාමාන්‍ය පිරිවැය සූත්‍රය භාවිතා කිරීමෙන් තොගවල පිරිවැය පැවරිය යුතුය. ආයතනයක් සමාන ස්වභාවයක් සහ ආයතනයට භාවිතයට ඇති සියලුම තොග සඳහා පිරිවැය සූත්‍රය | තොගය තක්සේරු කිරීමේදී තථ්‍ය පිරිවැය හෝ ආසන්න පිරිවැය පදනම යොදා ගැනීම. |

ක්‍රමය යොදා ගනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතුව රු. 4,038,696,594 ක් වූ හිතකර ද්‍රව්‍ය මිල විචලනයක් හා පොදු කාර්ය අනුපාත විචලනයක් සහ රු.1,776,858,186 ක අහිතකර ගබඩා මිල විචලනයක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් තිබුණි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රාග්ධන කාර්යයන් සම්බන්ධව ඉහළ මූල්‍ය මැදිහත් වීම හේතුවෙන් මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට සැලකිය යුතු බලපෑමක් කර ඇත. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොලැබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

භාවිතා කළ යුතුය. ඒ අනුව, මණ්ඩලය එහි තොග අගය කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරන අතර ජනන, සම්ප්‍රේෂණය, වත්කම් කළමනාකරණ සහ ව්‍යාපෘති අංශයේ ශ්‍රම පිරිවැය වාර්තා කිරීම සඳහා සත්‍ය පිරිවැය භාවිතා කරනු ලබන අතර එය 2020 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන වැඩවලින් සියයට 77 ක්, දේපල පිරියත සහ උපකරණවලින් සියයට 63 ක් සහ මණ්ඩලයේ තොගවලින් සියයට 45 කි. එබැවින්, දේපල පිරියත සහ උපකරණ, තොග සහ කෙරිගෙන යන වැඩවලින් වැඩි කොටසක් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිරිවැයට ඉදිරිපත් කෙරේ.

කෙසේ වෙතත්, සංකීර්ණත්වය සහ තොගවල විශාල ප්‍රමාණය හේතුවෙන්, මණ්ඩලයේ බෙදාහැරීමේ අංශ වෙනස් පිරිවැය තාක්‍ෂණයක්, එනම් සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කරයි. එල්.කේ.ඒ.එස් 2, ඡේද අංක 21 ක අනුව, ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, පහසුව සඳහා සම්මත පිරිවැය වැනි තොගවල පිරිවැය මැනීමේ තාක්ෂණික ක්‍රම භාවිත කළ හැක. සමාලෝචිත වර්ෂය තුළදී මුළු ශුද්ධ මිල විචලනය රු. මිලියන 347 (හර) ක් වූ අතර එය මුළු මිලදී ගැනීමේ GRN අගයෙන් සියයට 0.3 කි. එබැවින්, සම්මත මිල ආසන්න වශයෙන් පිරිවැයට සමාන බව මෙහිදි පැහැදිලිව පෙන්නුම් කරයි.

එබැවින් වර්ෂය සඳහා භාවිතා කර ඇති තක්සේරු ක්‍රමය සාධාරණ සහ අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව මණ්ඩලයේ මතයයි.

පොදු කාර්ය පිරිවැය

වාර්ෂිකව කලින් තීරණය කරන ලද අනුපාතයකට ප්‍රාග්ධන කාර්යයන් සඳහා පොදු කාර්ය පිරිවැය අවශෝෂණය කර ගැනීම මණ්ඩලයේ බෙදාහැරීමේ අංශ පමණක් සිදු කරයි. වාර්ෂික පොදු කාර්ය අවශෝෂණ අනුපාතය ඉදිකිරීම් කටයුතුවලට ඍජුවම සම්බන්ධ වන එක් එක් ඒකකයේ අයවැය පිරිවැය භාවිතා කරමින් ගණනය කරයි. අයවැය පිරිවැය බෙදාහැරීමේ අංශවල තථ්‍ය පිරිවැය සමඟ සසඳන විට, දරන ලද තථ්‍ය පිරිවැය අයවැය පිරිවැයට වඩා සියයට 10 කින් ඉක්මවා ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, භාවිතා කරන පොදු කාර්ය අවශෝෂණ අනුපාතය ද සාධාරණ වේ.

(ඇ) **එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

සම්ප්‍රේෂණ අංශයේ රු.බිලියන 172.2 ක් වූ ස්ථාවර වත්කම් සියලුම චංචල ස්ථාවර වත්කම්වලට අදාළ භෞතික සත්‍යාපනය සාර්ථකව සිදු කර ඇති අතර විගණනයේ අවධානය සඳහා වාර්තා සපයා ඇත. දැනට රටට අඛණ්ඩ විදුලි බල සැපයුමක් සැපයීමේදී විදුලි සම්ප්‍රේෂණ ජාලයේ අනිවාර්ය කොටස් වන පවත්නා එල්.කේ.ඒ.එස් 16 ට අනුව සෑම වසරකම ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනයක් සිදු

| | | |
|---|---|---|
| අතුරින් රු.බිලියන 171.2 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | සම්ප්‍රේෂණ මාර්ග, බලාගාර සහ යන්ත්‍රෝපකරණවලින් නිශ්චල වත්කම් ප්‍රධාන වශයෙන් සමන්විත වේ. | කිරීම. |
| **(ඇ) එල්.කේ.ඒ.එස් 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**<br><br>ලබා දුන් අධිකරණ තීන්දුව සහ ඊට අදාළ අභියාචනය පරිදි ගෙවිය යුතු රු. මිලියන 50 ක මුදල මණ්ඩලය විසින් හෙළිදරව් කර නොතිබුණි. | විදුලිය අවභාවිතය පිළිබඳ පුවත්පත්වල පළ කිරීම නිසා පැමිණිලිකාරියගේ කීර්තිනාමයට හානි වූ නිසා රු. මිලියන 50 ක අලාභයක් ඉල්ලා ජානකී නෙත්තිකුමාරි මහත්මිය විදුලිබල මණ්ඩලයට එරෙහිව කඩුවෙල දිසා අධිකරණයේ අංක 259/M දරන නඩුව පවරා තිබිණි. සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව 2019.08.22 දින කඩුවෙල දිසා අධිකරණ විනිසුරුවරයා විසින් තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද අතර පැමිණිලිකාරියට රු. මිලියන 50 ක මුදලක් ගෙවන ලෙස මණ්ඩලයට නියෝග කර ඇත. එම නියෝගය ප්‍රතික්ෂේප කරමින් තීන්දුවට එරෙහිව මණ්ඩලය අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී මෙම කරුණ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයට අනුව එම කාරණය හෙළිදරව් කිරීම. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් අඛණ්ඩව ප්‍රයෝජනයට ගනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.6 (ඉ) සහ 3 (ඇ) සඳහන් පරිදි සමාලෝචනය කර ඉදිරිකාලීනව ගලපා නොතිබුණි. නිදසුනක් වශයෙන්, සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. බිලියන 187.58 ක දේපළ, පිරියත හා උපකරණ තථ්‍ය ආයු කාලය තක්සේරු නොකර තවදුරටත් භාවිතා කරමින් සිටියි. | සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වලින් සියයට 53 කට වඩා ජනන බලාගාර වලින් සමන්විත වන අතර සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බලාගාරවල ආයු කාලය සමාලෝචනය කිරීමට කමිටුවක් දැනටමත් පත් කර ඇත. කෙසේ වෙතත්, බලාගාරවල සංකීර්ණත්වය සහ සුවිශේෂත්වය නිසා, එය තක්සේරු කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත.<br>මෝටර් රථ සඳහා සංශෝධිත ප්‍රයෝජනවත් ආයු කාලය ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2021 වර්ෂයේදී සිදු කෙරේ.<br>ශේෂ පත්‍රයේ වත්කම්වල ප්‍රධාන අංගය සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ මාර්ග වන අතර එය සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වලින් 38% කි. විගණන නිරීක්ෂණය විසඳීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු. මිලියන 189.54 ක හර ශේෂයක් (තොග හිඟය) සහ රු. | තොග ගැලපුම නිරවුල් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. | සිදු වූ දින සිට කෙටි කාලයක් තුළ තොග |

| | | |
|---|---|---|
| මිලියන 114.64 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි. | • ගැටළු විසඳීම සඳහා කමිටු පත් කිරීම.<br>• වගකිවයුතු සේවකයින්ට එරෙහිව විධිමත් පරීක්ෂණ පැවැත්වීම.<br>• නීති උපදෙස් ලබා ගැනීම, සහ<br>• අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම.<br>ඒ අනුව හිඟ ශේෂයෙන් සියයට 46 කට වැඩි ප්‍රමාණයක් සහ අතිරික්ත ශේෂයෙන් සියයට 30 කට වැඩි ප්‍රමාණයක් ඉහත ක්‍රියාවලියට ඇතුළත් වේ. | අතිරික්තය සහ හිඟය නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණ අංක 10/2434/423/034 හි අවශ්‍යතාවයන්ට අනුකූලව ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගත් රු. බිලියන 159.18 ක මුළු ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්.සී.සී) භාණ්ඩාගාරය විසින් පැවරිය යුතු අතර ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදලට සමාන මුදලක් මණ්ඩලය විසින් එල්.සී.සී වෙත ගෙවිය යුතුය. භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2014 සැප්තැම්බර් 30 දිනැති අංක PE/EN/CEB/Equity/2014 දරන ලිපිය අනුව, මෙම ණය මණ්ඩලයේ සෘජු ණය ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත්, කිසිදු උප ණය ගිවිසුමකට මහා භාණ්ඩාගාරය සමඟ එළඹ වි නොමැති වුවත් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණය ලෙස මණ්ඩලය මෙම ණය වාර්තා කර තිබුණි. එම නිසා, මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර මෙම ණය ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.<br>තවද, භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබූ රු. බිලියන 3.56 ක පොලී ගෙවීම ඇතුළුව රු. බිලියන 20.5 ක සහ රු. බිලියන 3.15 ක පොලී ගෙවීම ඇතුළුව රු. බිලියන 20.54 ක ණය ගෙවීම් පිළිවෙලින් මණ්ඩලයේ ස්කන්ධයට 2019 දී සහ 2020 දී | 2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ණය ස්කන්ධයට පරිවර්තනය කිරීම යන විෂය යටතේ භාණ්ඩාගාර ලේකම් විසින් අත්සන් කරන ලද 2014-09-30 දිනැති අංක: PE/EN/CEB/Equity/2014 ලිපියට අනුව, පුත්තලම ගල් අඟුරු බලාගාරය සම්බන්ධයෙන් ලබා ගත් සියලුම ණය මණ්ඩලය විසින් ලබා ගන්නා ලද සෘජු ණය ලෙස සැලකිය යුතු බව මණ්ඩලයට උපදෙස් දී ඇති අතර ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් මණ්ඩලයට ණය සේවා පිරිවැය පියවා ගැනීමට හැකිවන තෙක් මෙම ණය භාණ්ඩාගාරය විසින් පියවනු ඇත.<br>තවද, 2018-01-11 දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ පැවති රැස්වීමේ දී, මණ්ඩලයේ ශේෂ පත්‍රයේ වත්කම සහ වගකීම යන දෙකම පවතින බැවින් එකී ණය සේවාකරණය මණ්ඩලය වෙත පැවරිය යුතු බව අවධාරණය කරන ලදි.<br>ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දෙන නියෝජිතායතනය අතර දැනටමත් ණය ගිවිසුම අත්සන් කර ඇති බැවින් භාණ්ඩාගාරය මණ්ඩලයට ණය පැවරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන තෙක් ණය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වේ.<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2019-10-17 දිනැති අංක: PEP/I/CEB/2/II (i) දරන ලිපිය මගින් භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති උපදෙස් සැලකිල්ලට ගනිමින්, මණ්ඩලය විසින් රු. 16,942,798,790.95 ක ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහ රු. 3,556,442,931.30 ක පොලී ගෙවීම 2019 වර්ෂය සඳහා මණ්ඩලයේ පොත්වලට ගලපා ඇත. තවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2021-01-15 දිනැති අංක: PED/1/CEB/02/11 (i) දරන ලිපිය අනුව රු. 20, 536,545,932.04 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වාර්තාවලට අනුකූලව මණ්ඩලයේ පොත්වල රජයෙන් ලද ප්‍රාග්ධනය ලෙස ගලපා ඇත. ඒ අනුව භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති උපදෙස් අනුව මණ්ඩලයේ පොත්වලට ගැලපීම් කර ඇත.<br>1969 අංක 17 ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවෙන් ලිඛිත නියෝගය ලැබුණු පසු මණ්ඩලයේ පොත් සකස් කිරීමට හෝ හිඟ ශේෂ ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| මාරු කර තිබුණි. කෙසේ වෙතත්, ස්කන්ධයට මාරු කරන ලද පොලිය මණ්ඩලය විසින් ආදායම් ප්‍රකාශයට පොලී වියදමක් ලෙස ඇතුළත් කර තිබුණු අතර එම වියදම මණ්ඩලය විසින් නොදරන ලදි. එම නිසා, 2019 සහ 2020 වසරවල අලාභය පිළිවෙලින් රු. බිලියන 3.56 කින් සහ රු. බිලියන 3.15 කින් වැඩියෙන් දැක්වුණි.<br>තවද, රජයේ අනුමැතිය සහ ඇපවීම් සහිතව මණ්ඩලයට ලබා දුන් ණයවලට අදාළව ශ්‍රී ලංකා රුපියල නැවත ඇගයීම සම්බන්ධව යම් අලාභයක් හෝ ලාභයක් ලදහොත් එය ඒකාබද්ධ අරමුදලට අය කළ යුතු අතර එම අලාභය හෝ ලාභය රජය විසින් දරනු ලබන බවට 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 42 (6) වගන්තියේහි සඳහන්ව තිබියෙදී මණ්ඩලය විසින් 2019 සහ 2020 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. බිලියන 11.89 ක සහ රු. මිලියන 20.86 ක විනිමය අලාභයක් ආදායම් ප්‍රකාශයට අය කර තිබුණි. එම නිසා, 2019 සහ 2020 වසරවල අලාභය පිළිවෙලින් රු.බිලියන 11.89 කින් සහ රු. මිලියන 20.86 කින් වැඩියෙන් දැක්වුණි. | වැනි වගන්තියේ 6 වැනි උප වගන්තිය ප්‍රකාරව, විනිමය අනුපාත අවදානම ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන බැවින් භාණ්ඩාගාරය හරහා ලබා ගෙන ඇති විදේශ විනිමය ණය මත ප්‍රාග්ධන සහ ණය පොලී සම්බන්ධයෙන් විදේශ විනිමය උච්චාවචනයන් හරහා ලැබෙන කිසිදු ලාභයක් හෝ අලාභයක් මණ්ඩලය විසින් දැරිය යුතු නොවේ. ආපසු ගෙවිය යුතු හිඟ ණය මණ්ඩලය විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ එකඟ වූ විනිමය අනුපාතිකයට තක්සේරු කෙරේ.<br>කෙසේ වෙතත්, මෙම වියදම පියවා ගැනීම සඳහා මණ්ඩලය විසින් රජය මගින් ලබාගෙන ඇති එවැනි ණය පාඩු පියවා ගැනීමට පොලී අනුපාතයක් යටතේ රජය මණ්ඩලය සමඟ උප ණය ගිවිසුමකට එළඹේ.<br>මෙම ණය මණ්ඩලය විසින් ලබා ගන්නා ඍජු ණය ලෙස සැලකීමට භාණ්ඩාගාරය තීරණය කර ඇති බැවින් එවැනි උප ණය ගිවිසුම්වලට එළඹී නොමැත. මණ්ඩලයේ ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් ණය සේවාකරණය භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලබන බැවින් ණය දෙන ආයතනයට ගෙවන ලද තථ්‍ය ගෙවීම් මණ්ඩලයට ණය ස්කන්ධයට පරිවර්තනයක් ලෙස පවරා ඇත.<br>මණ්ඩලය මෙම ණය පනතට සමගාමීව මුලින් ලබාගත් අනුපාතයට සටහන් කර ඇති අතර ඉන් පසුව ණය නැවත තක්සේරු කර නොමැති බැවින්, ප්‍රාග්ධන ආපසු ගෙවීමට අදාළ විනිමය අලාභය ද භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද ණය ස්කන්ධයට පරිවර්තනය කිරීමට ඇතුළත් කර ඇත.<br>ඒ අනුව, 2020 වර්ෂයේ ආරම්භයේ සිට 2020 වසර අවසානය දක්වා විනිමය අනුපාත විචලනයට අදාළව රු. 20,862,022.88 ක විනිමය අලාභයක් 2020 මූල්‍ය වර්ෂය තුළ අන්තර්ගත කර ඇති අතර 2019 වසර අවසානය දක්වා විනිමය අනුපාත විචලනයට අදාළව රු. 6,154,069,044.78 ක විනිමය අලාභයක් 2019 වර්ෂයට ගලපා ඇත.<br>තවද, 2019 වසරේ ණය ආපසු ගෙවීමක් ලෙස ගිණුම්ගත කර ඇති රු. 5,735,412,848.45 ක් වූ 2019 ණය ස්කන්ධයට පරිවර්තනයට ඇතුළත් වූ විනිමය අලාභය 2020 දී නිවැරදි කර ඇති අතර 2019 වර්ෂයේ මුළු විනිමය අලාභය රු. 11,889,481,893.00 කි. | |
| (ඇ) ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 න් පසුව විදේශ ණයවලින් ලද රු. බිලියන 25.23 ක් මහා භාණ්ඩාගාරයෙන් ලද උප ණය ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණු අතර මෙම ණය 2014 දෙසැම්බර් 31 න් පසුව භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශනවල | විදේශ මූල්‍ය සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලබා දීම, සේවාකරණය, ආපසු ගෙවීම සහ ගිණුම්කරණය යන යාන්ත්‍රණය විධිමත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2015-03-09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සහ මේ සම්බන්ධයෙන් 2015-03-18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මණ්ඩලය 2015 වසරේ සිට ණය සේවාකරණය සහ ආපසු ගෙවීමට අපේක්ෂා කරයි. | අවශ්‍ය කරුණු හෙළිදරව් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | උප ණය ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද 2015 මාර්තු 18 දින ගත් කැබිනට් තීරණ අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ආපසු ගෙවීම මණ්ඩලය වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය සඳහා වාරික ගෙවීම සහ පොලී ගෙවීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු අතර වෙන්කිරීමක් හෝ කර නොතිබුණි. එම නිසා, මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර, ආපසු ගෙවීමේ කොන්දේසි (වාරික සහ පොලී ගෙවීම) පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක. | මණ්ඩලය වෙනුවෙන් ණය ලබාගෙන ඇති නමුත් ණය ගිවිසුම් දැනටමත් ශ්‍රී ලංකා රජය සහ ණය දෙන නියෝජිතායතනය අතර අත්සන් කර ඇති බැවින්, මුලදී මෙම ණය ලැබීම් භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත.<br>ඉන් අනතුරුව, 2018-01-11 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද රැස්වීමේදී, 2014-12-31 න් පසුව මහා භාණ්ඩාගාරය හරහා මණ්ඩලය වෙත ලබා දී ඇති ණය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව රජයේ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීමට තීරණය කරන ලදි.<br>එම නිසා, මෙම ශේෂය ස්කන්ධයට මාරුකිරීමට භාණ්ඩාගාරයට උපදෙස් ලැබෙන තුරු මණ්ඩලය එය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත. | |
| (ඇ) | කිසිදු උප ණය ගිවිසුමකට මහා භාණ්ඩාගාරය සමඟ එළඹ වි නොමැති වුවත් එකතුව රු. බිලියන 54.71 ක විදේශ ණය හයක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ණය වශයෙන් හඳුනාගෙන තිබුණි. එම නිසා මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර මෙම ණය ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක. | මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම් අත්සන් කර නොමැති මෙම ණය, මණ්ඩලය වෙනුවෙන් භාණ්ඩාගාරය හරහා ලබාගෙන ඇත.<br>මණ්ඩලයට ණය මුදල් ලැබෙන බැවින් මේවා භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වේ. තවද, ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දෙන ආයතනය අතර ණය ගිවිසුම් දැනටමත් අත්සන් කර ඇත. | මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම් අත්සන් කිරීම. |
| (ඉ) | 2013 වසරට පෙර රාජ්‍ය ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරන ලද කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීම වෙනුවට, පිරිවැය අනුව තක්සේරු කර තිබුණු අතර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු දෑ සහ රඳවාගත් ඉපයීම් රු. මිලියන 66.99 ක් බැගින් | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් සහ රජයේ රෝහල්වලින් මණ්ඩලය විසින් සිදු කරන ලද කාර්යයන් සඳහා ලැබිය යුතු මුදල් එකතු කිරීමේ සම්භාවිතාව සැක සහිත බැවින්, 2013 ට පෙර, ආදායම මුදල් පදනම මත හඳුනාගෙන ඇති අතර, කාර්යයන් සඳහා තථ්‍ය පිරිවැය ගනුදෙනුකරුගෙන් මුදල් එකතු කරන තුරු ගිණුම් පොත්වල ලැබිය යුතු ලෙස පෙන්වා ඇත. 2020-12-31 වන විට, රාජ්‍ය ආයතන සඳහා සිදු කරන ලද කාර්යයන්වල තථ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත වටිනාකම අතර වෙනස රු. 43,421,695.18 ක් වන අතර එය විමසුමේ දක්වා ඇති රු. 66,987,761 ක් නොවේ.<br>කෙසේ වෙතත්, රැස්වීම් සටහන් අංක. 20.14.279 යටතේ 2020-10-06 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිනිය, 2020-12-21 දිනැති ඇයගේ ලිපි | මෙම කාර්යයන් ඉන්වොයිස් වටිනාකම් මත අගය කර ඒ අනුව ඒවා සටහන් කිරීම. |

අඩුවෙන් දැක්වුණි. මෙම හිඟ ශේෂයන් පියවීමේ විස්තර සහ ඉන්වොයිසි 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

අංක CEB/FM/AFM(Corp)/DFM(P&I)/ණය ගැතියන් දරන ලිපිය මගින් මණ්ඩලය මුහුණ දී ඇති මුදල් ප්‍රවාහ ගැටළු මගහරවා ගැනීම සඳහා රාජ්‍ය ආයතනවලින් දිගුකාලීන හිඟ මුදල් අයකර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහය ඉල්ලා ඇති අතර මෙතෙක් අපට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත.

තවද, අංක 2020/03, 03.03 දරන රැස්වීම් සටහන යටතේ 2020-12-21 දින පැවති රැස්වීමේදී, අය කර ගත නොහැකි දිගුකාලීන ලැබිය යුතු මුදල් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කරන ලෙස විගණන කමිටුව වත්කම් කළමනාකරණ අංශයට නියෝග කර ඇත. අංක 21.06.128A දරන රැස්වීම් සටහන යටතේ 2021-04-07 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මණ්ඩලය විසින් මෙය තහවුරු කරන ලද අතර, නොපසුබට උත්සාහයෙන් පසුව වුවද රාජ්‍ය ආයතනවලින් ප්‍රමාද වූ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට වත්කම් කළමනාකරණ අංශයට නොහැකි විය. ඒ අනුව, නි.ස (W&AS) මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක නිරත වී ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (SLFRS) 9 - මූල්‍ය උපකරණ, 5.5.4 වගන්තියට අනුකූලව මෙම ශේෂයන් නැවත අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත මූල්‍ය අලාභය සැලකිල්ලට ගනිමින් මණ්ඩලය විසින් මෙම ලැබිය යුතු ශේෂයන් මත සම්පූර්ණ හානිකරණ ප්‍රතිපාදන සලසා ඇත.

තවද, SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින අයභාරය, (9) (e) වගන්තිය අනුව, මෙම ලැබිය යුතු ශේෂ එකතු කිරීමේ හැකියාව නොමැති බැවින්, විමසුමේ සඳහන් කර ඇති පරිදි ලැබිය යුතු ශේෂය (එනම්, ඉන්වොයිස් වටිනාකම) නැවත ප්‍රකාශ කිරීමට යෝජනා නොකරයි. SLFRS 9 - මූල්‍ය උපකරණ, 5.5.4 වගන්තියේ විධිවිධානවලට අනුව, ඉහත කාර්යයන්වල ඉන්වොයිස් අගයන් හඳුනා ගැනීම සඳහා පිරිවැයට දක්වා ඇති ලැබිය යුතු ශේෂ ගිණුම්වල නැවත ප්‍රකාශ කළද, හානිකරණ සඳහා සියයට 100 ප්‍රතිපාදනයක් සැලසිය යුතුය.

ඒ අනුව, එම ශේෂයන් ආපසු අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉන්වොයිසි අගයන් (ලැබිය යුතු මුදල් සහ රඳවා ගත් ඉපැයීම්වල වැඩිවීම) නැවත ප්‍රකාශ කිරීමෙන් හානිකරණ ප්‍රතිපාදනයක් (ලැබිය යුතු මුදල් සහ රඳවා ගත් ඉපැයීම්වල අඩුවීම) හඳුනා ගැනීමට හේතු වනු ඇත.

ඉහත සියල්ල සලකා බැලීමේදී, ඉන්වොයිසි අගයන්

| | | |
|---|---|---|
| | නැවත ප්‍රකාශ කිරීම ඉහත සඳහන් කළ ගිණුම්කරණ ප්‍රමිතිවල අදාළ විධිවිධානවලට අනුකූල නොවන අතර එය මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ඇත. එබැවින්, විගණන විමසුමේ දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශනවල කිසිදු අඩුවෙන් දැක්වීමක් නොමැත.<br>විගණනය සඳහා ඉල්ලුම් කරන ලද තොරතුරු බොහොමයක් දැනටමත් අදාළ ඒකකවල ප්‍රධානීන් විසින් ඉදිරිපත් කර ඇති අතර අවශ්‍ය ඕනෑම අමතර තොරතුරක් ඔවුන්ගෙන් ලබා ගත හැකිය. | |
| (ඊ) 2016 වර්ෂයේ බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබූ රු. බිලියන 5 න් රු. මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ ගාස්තු ගෙවීම ලෙස ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබුණු අතර රු. බිලියන 1.5 ක් රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණි. ඉතිරි මුදල වන රු. බිලියන 3.0 ක් රඳවාගත් ඉපයීම්වලට අය කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් ණය ගැතියන් ලෙස දැක්වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයෙන් කළමනාකරණ සේවාවන් ලබාගෙන නොතිබුණි. එම නිසා, වර්ෂයේ අලාභය රු. මිලියන 500 කින් වැඩියෙන් දැක්වුණි. | 2019.10.16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක. PDE/I/CEB/2/11/(iii) ලිපිය මත පදනම්ව, 2019 වර්ෂයේදී, මෙම ගෙවීම භාණ්ඩාගාරයට ගෙවන ලද “කළමනාකරණ ගාස්තු” ලෙස සලකනු ලැබූ අතර, 2017 වසරේ සිට වසර 10 ක කාල සීමාවක් තුළ ක්‍රමක්ෂය කරයි. | 2016 වර්ෂයේ බද්දක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවූ රු. බිලියන 5 ක මුදල ස්කන්ධ ප්‍රකාශනයට අය කිරීම. |
| (උ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 6.18 ක් වටිනා කාර්යයන් 7,546 ක් බෙදාහැරීම් අංශවල වත්කම්වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. එම වත්කම්වලට අදාළ ක්ෂයවීම් ආදායම් ප්‍රකාශනයට අය කර නොතිබුණි. | සම්පූර්ණ කරන ලද කාර්යයන් නියමිත වේලාවට වත්කම්වලට ප්‍රාග්ධනීකරණය කිරීමට අඛණ්ඩ උත්සාහයන් ගනු ලැබේ. දිගුකාලීනව පවතින ප්‍රාග්ධන කාර්යයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ භාරදීම සඳහා පළාත් මට්ටමේ කමිටු පත් කර ඇත. ඒ අනුව, 2021 මැයි 31 වන විට වසර 4 කට වැඩි කාර්යයන් අතුරින් ඩී.ඩී1 විසින් සියයට 21 ක් සහ ඩී.ඩී3 විසින් සියයට 28 ක් ප්‍රාග්ධනීකරණය කර ඇත. | සම්පූර්ණ කරන ලද කාර්යයන් ප්‍රාග්ධනීකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඌ) 2012 දී නිම කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියට අදාළ මුළු පිරිවැය වූ රු. මිලියන 979.88 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. එම නිසා, සමාලෝචිත | මූලික වත්කම් හුවමාරුවෙන් පසු 2020 දෙසැම්බර් වන විට කෙරීගෙන යන වැඩ ගිණුමේ රු. 979,888,779 ක වියදම් එකතු වී ඇත. මෙම මුදල ප්‍රධාන වශයෙන් පුද්ගල වියදම්, බේරුම්කරණය සඳහා නෛතික ගාස්තු සහ ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය යනාදිය මඟින් සමන්විත වේ. මෙම ඉතිරි මුදල පැවරීම සඳහා ව්‍යාපෘති කාර්යාලයේ පවතින | එම වියදම් ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා ක්ෂය වීම සහ රඳවා ගත් ඉපයීම් පිළිවෙලින් රු. මිලියන 27.99 කින් සහ රු. මිලියන 195.98 කින් අඩුවෙන් දැක්වුණි. | ගැටලු විසඳීමට දැනටමත් ක්‍රියා කර ඇති අතර මෙය 2021 වසර තුළදී ඉටු කෙරේ. | |
| (එ) 2014 වර්ෂයේදී නිම කරන ලද පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වාහනවල මුළු පිරිවැය රු. මිලියන 179.19 ක් වූ අතර එය ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. එම නිසා, රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 179.19 කින් අඩුවෙන් දැක්වුණි. | මූලික වත්කම් පැවරීමෙන් පසු රු. 528,013,647.76 ක එකතු වී ඇති වියදම අදාළ අංශ වෙත 2020 වර්ෂයේ දී මාරු කරන ලදි. කෙසේ වෙතත්, වාහනවල අයිතිය මණ්ඩලයට පවරා නොදීම හේතුවෙන් වාහන මිලදී ගැනීම සඳහා දැරූ රු. 179,194,890 ක් (වාහන 10 ක්) ගිණුම්වල පැවති අතර වාහනවල අයිතිය මණ්ඩලයට පැවරීමෙන් පසු මෙම මුදල අදාළ අංශ වෙත පැවරේ. | එම වාහන ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඒ) කපා හරින ලද ශේෂයන්ට එරෙහිව අවසන් කරන ලද තොග ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු එකතුව රු. මිලියන 18.76 ක් වූ පොලී ආදායම, වැට් බදු සහ අධිභාර, නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. එම නිසා ණයගැති ශේෂයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඔ) වීදි ආලෝකකරණ නඩත්තු වියදම්වලින් අය කර ගත නොහැකි රු. මිලියන 30.56 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | පළාත් සභා මගින් සිදු කරනු ලබන වීදි ලාම්පු නඩත්තුව මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරනු ලබන අතර විදුලිබල අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස සටහන් කරයි. ඉහත ශේෂය 2013 වසරේ සිට දකුණු පළාත විසින් සිදු කරන ලද එවැනි ප්‍රතිපූරණවලට අදාළ සමුච්චිත ශේෂය වේ. කෙසේ වෙතත්, ඉහත ශේෂයට මෙතෙක් අමාත්‍යාංශයෙන් මුදල් ලැබී නොමැති අතර, එම නිසා අනාගත වියදම් ප්‍රතිපූරණය නොකිරීමට දකුණු පළාත තීරණය කර ඇත. | එම මුදලේ අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ප්‍රතිපාදන යෙදීම. |
| (ඕ) රු. මිලියන 29.97 ක ගෙවිය යුතු ශේෂය, කොළඹ නගර කාර්යාලයේ එකතු කිරීමේ පාලන ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි. එම නිසා ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ශේෂය 2021 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කෙරේ. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ක) සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස 2021 ජනවාරි 01 සිට 2021 ජනවාරි 15 දක්වා කාලයට අදාළ ආදායම හඳුනාගැනීම හේතුවෙන් විවිධ | බිල්පත් සාරාංශය සහ දින දර්ශන මාසයට අදාළ කාල සීමාව අතර වෙනස හේතුවෙන් මෙම ශේෂය නිර්මාණය වී ඇත. කෙසේවෙතත්, බිල්පත් සාරාංශය, දින දර්ශන මාසය සමඟ සැසඳීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. එබැවින් 2021 වසරේ සිට | බිල්පත් සාරාංශ කාලය, දින දර්ශන මාසය සමඟ සැසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| ණයගැති ශේෂය රු. මිලියන 585.69 කින් වැඩියෙන් දැක්වුණි. එම නිසා, වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | එවැනි ශේෂයක් නිර්මාණය නොවේ. | |
| (ග) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ රු. බිලියන 1.57 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) ආදායම් ප්‍රකාශනයට අය කර නොතිබුණි. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | රු. 1,573,231,409 ක් වූ ලැබිය යුතු ඊ.එස්.සී, 2019 සහ 2020 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට කපා හැරීමට අවශ්‍ය (වසර තුනක කාල සීමාව ඉක්මවන) දැනටමත් කාල සීමාව ඉක්ම වූ මුදල නියෝජනය කරයි. කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අදාළ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, මෙම ඊ.එස්.සී ශේෂය කපා හැරීම වෙනුවට මෙම කරුණ විදුලිබල අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට යොමු කිරීම මඟින් මෙම ශේෂය අයකර ගැනීමට හෝ වෙනත් ගෙවිය යුතු මුදලකට එරෙහිව පියවීමට විකල්ප සොයා බැලීම, මණ්ඩලයේ විගණන කමිටුවේ නිර්දේශය විය.<br>එය 2018 ජාතික අයවැය යෝජනාවල කොටසක් ලෙස මහා භාණ්ඩාගාරය වෙත දන්වා ඇති අතර බදු සහනවල කොටසක් ලෙස 2020 වර්ෂයේදී විදුලිබල අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත නැවත දැනුම් දෙන ලදි. පිළිතුරක් මෙතෙක් ලැබී නැත. | මෙම කරුණ නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඞ) අසාමාන්‍ය බැර ශේෂයන් හිලවු වීම හේතුවෙන් බෙදාහැරීම් අංශවල කෙරිගෙන යන වැඩ ශේෂය රු. මිලියන 52.06 කින් අඩුවෙන් දැක්වුණි. | රු. 26,014,986 ක අසාමාන්‍ය බැර ශේෂයන් සඳහා හේතු හඳුනාගෙන ඇති අතර ඒවා 2021 වර්ෂයේදී නිවැරදි කරනු ලබන අතර, පුද්ගල කාර්යය පදනම මත රු. 26,045,997 ක් වූ ලයිටිං ශ්‍රී ලංකා රත්නපුර ව්‍යාපෘතියට අදාළ කාර්යයන් සමාලෝචනය කර නිරවුල් කිරීමට කටයුතු ආරම්භ කරමින් ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ච) වියදම්වලට මාරු නොකර රු. මිලියන 912.69 ක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. තවද, අසාමාන්‍ය බැර ශේෂය රු. මිලියන 245.53 ක් මාර්ගස්ථ තොග ගිණුමේ නිරවුල් නොකර පවතී. | ශේෂය නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ජ) මූල්‍ය ප්‍රකාශනවල වාහන 12 ක වටිනාකම් මඟ හැරීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂය අඩුවෙන් දැක්වුණි. | වාහන සොයා ගැනීමට සහ ස්ථාවර වත්කම්වල යෝග්‍ය ලෙස සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන ස්ථාවර වත්කම් ලේඛනයට වාර්තා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ට) කැලණිතිස්ස Combined Cycle විදුලි බලාගාරය හා සම්බන්ධ අසම්පූර්ණ වත්කම්වල වියදම් | 2021 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් විදුලි බලාගාරයේ වටිනාකම රු. මිලියන 175.10 කින් වැඩියෙන් දැක්වුණි. තවද මෙම අසම්පූර්ණ වත්කම් සම්බන්ධව ප්‍රාග්ධන වියදම් රු. මිලියන 323.28 ක් සහ ක්ෂයවීම් රු. මිලියන 27.04 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් ප්‍රකාශනයට අය කර තිබුණි. එම නිසා වර්ෂයේ අලාභය රු. මිලියන 350.32 කින් වැඩියෙන් දැක්වුණු අතර කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 498.38 කින් අඩුවෙන් දැක්වුණි. | | |
| (ය) 2018 සහ 2019 වර්ෂයන්හි නිම කරන ලද වත්කම්වලට අදාළ ක්ෂයවීම් රු.මිලියන 54.14 ක් සමාලෝචිත වර්ෂය තුළදී ජනන අංශයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | සටහන් කර ගන්නා ලද අතර ඉදිරියේ දී එවැනි වැරදි අවම කිරීමට පියවර ගනු ලැබේ. | අනාගතයේදී එවැනි වැරදි වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (ඩ) වසරකට වැඩි කාලයක් තිස්සේ පවතින රු. 690,183 ක අහුරු වූ චෙක්පත් සඳහා මුදල් රෙගුලාසි 486 හි අවශ්‍යතා අනුව මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | ශේෂයන් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ඉහත කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ණ) 2015 වර්ෂයේ සිට අවසන් නොවී පවතින රු. මිලියන 167.25 ක් වටිනා ව්‍යාපෘති දෙකක් නිරවුල් නොකර කෙරිගෙන යන වැඩ යටතේ පෙන්වයි. | අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ව්‍යාපෘති දෙකෙහි කෙරිගෙන යන වැඩ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | එකී ව්‍යාපෘතිවල කෙරීගෙන යන වැඩ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ත) 2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කරාපිටිය රෝහලේ විදුලි නඩත්තුව සඳහා වෙන් කරන ලද ශ්‍රම පිරිවැය ලෙස මණ්ඩලය ජී.ඩී ආදායමට රු. 3,568,183 ක මුදලක් අය කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ජී.ඩී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, විදුලි නඩත්තු කාර්යයන්ට එරෙහිව ආදායම් ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල | සටහන් කර ගන්නා ලද අතර නිසි ගිණුම්කරණ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. | එවැනි ගනුදෙනු වාර්තා කිරීම සඳහා නිසි ගිණුම්කරණ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කිරීම. |

| | | |
|---|---|---|
| සටහන් අංක 2.1 හි විධිවිධානවලට එරෙහිව මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. බෙදාහැරීමේ අංශය 4 හි 2020 වර්ෂය සඳහා එකී කාර්යයන්ට අදාළ ආදායම් සහ වියදම් සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. එබැවින්, විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සඳහා වන බලපෑම ගණනය කළ නොහැක. | | |
| (ද) උපචිත තාප විදුලිය මිලදී ගැනීම්වලට අදාළව කර ඇති අධික ප්‍රතිපාදන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 0.99 කින් වැඩියෙන් දැක්වුණි. | 2020 වර්ෂය සඳහා සහතික කළ ඉන්වොයිසිවල මුළු වටිනාකම රු. බිලියන 72.63 කි. රු. බිලියන 75.7 ක් වූ ලෙජර් ශේෂය පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.<br><br>සහතික කළ ඉන්වොයිස් — 74,623,248,756.56<br>2020 දී ආපසු හරවන ලද 2019 අධික උපචිත ප්‍රතිපාදන — (2,937,738,548.88)<br>2020 අධික උපචිත ප්‍රතිපාදන — 3,921,791,769.36<br>ණයවර ලිපි ගාස්තු, වැට් සහ කොමිස් — 161,187,879.76<br>75,768,489,856.80<br><br>2020 අධික උපචිත ප්‍රතිපාදන සහ ආපසු හරවන ලද 2019 අධික උපචිත ප්‍රතිපාදන අතර වෙනස රු. බිලියන 0.9 ක ප්‍රමාණාත්මක වෙනසට හේතු වී ඇත. කෙසේ වෙතත්, වියදම් ගිණුමේ අධික/අඩු උපචිත ප්‍රතිපාදන වලක්වා ගැනීම සඳහා කාලීනව සහතික කළ ඉන්වොයිසි ලබා ගැනීම සහ ඒ අනුව මාසික ගිණුම්වල ගිණුම් තැබීමට 2021 ජනවාරි සිට දැනටමත් කටයුතු සම්පාදනය කර ඇත. | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ උපචිතයන් නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ධ) ගිගාවොට් 77.2 ක පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් මඟ හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 1.1 කින් අඩුවෙන් දැක්වුණි.<br>(න) 2019 වර්ෂය තුළදී රු. මිලියන 212 ක් වූ ගිගාවොට් 12.2 ක පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් 2020 වර්ෂයේ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිණුමට ඇතුළත් කර | ලද ඉන්වොයිසි සහ විෂයභාර ඉංජිනේරුවරයා විසින් සකස් කරන ලද 'මාසික සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ජනන වාර්තාව' භාවිතා කරමින් NCRE මාසික උපචිතයන් ගිණුම්ගත කෙරේ. අලුතින් ආරම්භ කරන ලද බලාගාරවලින් ඉන්වොයිසි සාමාන්‍යයෙන් ප්‍රමාදයක් සහිතව ලැබෙන අතර සමහර අවස්ථාවලදී පවතින බලාගාර පවා විවිධ හේතු නිසා සැලකිය යුතු ප්‍රමාදයකින් ඔවුන්ගේ ඉන්වොයිසි ඉදිරිපත් කරයි. එබැවින්, ප්‍රමාදයක් සහිතව ලැබෙන ඉන්වොයිසි තොරතුරු ලැබෙන කාල සීමාව තුළ සටහන් වේ. මෙම මිලදී ගැනීම් 2021 | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ සියලු බලශක්ති මිලදී ගැනීම් නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| තිබුණි. එම නිසා වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ජනවාරි මාසය සඳහා වන ‘NCRE ජනන වාර්තාවේ’ ඇතුළත් කර ඇති බැවින් මෙම ප්‍රමාද වූ ඉන්වොයිසිවලින් සමහරක් 2021 ජනවාරි ගිණුම්වලට ඇතුළත් කර ඇත. | |
| (ප) වසර 15 ක කොන්ත්‍රාත් කාලය අවසන් වූ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දක්වා පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 808 ක් ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා, වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | මුල් කාලසීමාව අවසන් වූ SPPAs අලුත් කිරීම විවිධ හේතු නිසා ගිවිසුම කල් ඉකුත් වූ මොහොතේම සිදු නොකළේය. කෙසේ වෙතත්, අත්සන් කරන ලද ගිවිසුමක් නොතකා මෙම බලාගාර අඛණ්ඩව ක්‍රියාත්මක විය. එබැවින්, ගිවිසුම දීර්ඝ කිරීම අත්සන් කිරීමට යටත්ව ඉන්වොයිසි උපචිත කිරීම ඒවා ලැබුණු විට සිදු කරන ලදි. එබැවින්, 2020 වර්ෂය සඳහා වන උපචිතයක් ලෙස 2021 ජනවාරි මාසය සඳහා වූ ගිණුම්වල එකතුව රු. මිලියන 900 ක උපචිතයක් ඇත. | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ සියලු බලශක්ති මිලදී ගැනීම් නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (බ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාද වී ගෙවීමේ පොලිය රු.මිලියන 2,481 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා සහතික කරන ලද ප්‍රමාද වී ගෙවීමේ පොලී ගණනය කිරීම්වලට අනුව එය රු. මිලියන 2,885 ක් විය. එම නිසා වර්ෂයේ අලාභය රු. මිලියන 404 කින් අඩුවෙන් දැක්වුණි. | 2020 වර්ෂය සඳහා සහතික කරන ලද ප්‍රමාද වූ පොලිය රු. මිලියන 2,885 ක් වන අතර 2019 වර්ෂයට අදාළව රු. මිලියන 383 කට අධික උපචිත මුදලක් සහ 2020 වර්ෂය සඳහා රු. මිලියන 21 ක ඌන උපචිත මුදලක් 2020 වර්ෂයේ ගිණුම්වල ඇතුළත් කර ඇත.<br>කෙසේ වෙතත්, වියදම් ගිණුමේ අධික/ඌන උපචිතයන් වළක්වා ගැනීම සඳහා ඉන්වොයිසිවල සහතික කළ අගයන් භාවිතා කරමින් ප්‍රමාද වූ පොලිය ගණනය කිරීමට 2021 ජනවාරි මාසයේ සිට කටයුතු කර ඇත. | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ ප්‍රමාද වී ගෙවීමේ පොලී නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ම) අපහරණය කරන ලද රු. මිලියන 14 ක් වූ ස්ථාවර වත්කම් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල තවදුරටත් දැක්වුණි. | ස්ථාවර වත්කම් නිවැරදි තොරතුරු සමඟ යාවත්කාලීන කිරීම සඳහා සම්ප්‍රේෂණ අංශයේ සියලුම ශාඛා වෙත උපදෙස් දීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම. |
| (ය) පාර්ශව දෙක අතර ගිවිසුමකට එළඹ වී නොමැතිවීම හේතුවෙන් 2020 මාර්තු මාසයේදී සම්බන්ධිත පාර්ශවයෙකුගෙන් ලද රු. බිලියන 2 ක ණය මුදලෙහි පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. එම නිසා, ණය ආපසු ගෙවීමේදී මූල්‍ය තත්වයට ඇති කරන බලපෑම ගණනය කළ නොහැක. | මණ්ඩලයේ අහිතකර මූල්‍ය තත්ත්වය සහ 2020.02.25 දිනැති අංක 20.03.060 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ජාතියට අඛණ්ඩව විදුලිය සැපයීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා මෙම ණය පහසුකම LECO වෙතින් ලබා ගෙන ඇත. ණය ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙපාර්ශ්වය විසින් කෙටුම්පත් ණය ගිවිසුමක් සමාලෝචනය කරමින් සිටී. | ණය ගිවිසුම අත්සන් කිරීමට වහාම පියවර ගැනීම. |
| (ර) 2007 සිට අධිභාර ගණනය කිරීම් නවතා තිබියදී ගිණුම් අංක 3670100474හි හිඟ ශේෂයට | මෙම හිඟ අධිභාර ශේෂය වූ රු. 6,540,244 අධිකරණ නඩු අංක. 43932/එම්.ආර් (දිස්ත්‍රික් උසාවිය - කොළඹ) ට අදාළ වේ. මණ්ඩලයේ | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| අදාළව මණ්ඩලය විසින් අධිභාරය ලෙස රු. මිලියන 6.54 ක මුදලක් වැරදි ලෙස අය කර තිබුණි. එම නිසා, රඳවා ගත් ඉපැයීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කළමනාකාරිත්වය විසින් අධිකරණ නඩුව අවසන් වන තුරු මෙම ශේෂය වෙනම රඳවා තබා ගන්නා ලෙස උපදෙස් දී ඇත. | |
| (ල) ගල් අඟුරු නැව්ගත කිරීමේ ගාස්තු සඳහා රු. මිලියන 63.56 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එම නිසා, එම වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | අදාළ ගෙවීම් සම්බන්ධව LCC සමඟ සාකච්ඡා කරමින් පවතින බැවින් 2020.12.31 වන විට මෙම රු. මිලියන 63.56 ක මුදල මණ්ඩලයේ ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල සපයා ඇති සැසඳුම මඟින් 2020 වර්ෂය සඳහා ගිණුම් වසා දැමීමෙන් පසු 2021.03.22 දින රු. 22,520,185.72 ක් පමණක් පියවා ඇති බව ප්‍රමාණවත් ලෙස අනාවරණය කර ඇත. | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ උපචිතයන් නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ව) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව නැවත ප්‍රකාශ කර තිබුණි. | මණ්ඩලයේ ක්‍රියාකාරීත්වයේ සංකීර්ණත්වය සහ ගනුදෙනු පරිමාව හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම ප්‍රධාන වශයෙන් සිදු කරයි. කෙසේවෙතත්, මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම වැළැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම වැළැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ශ) 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් නොකර අන්තර් අංශවල ජංගම ගිණුමේ ශේෂයන් ලෙස පැවතුණි. | බෙදාහැරීමේ අංශ විමධ්‍යගත කිරීම සිදු වූ 2002 වර්ෂයේ සිට එම ශේෂය ඉදිරියට ගෙනැවිත් තිබේ. උපකාරක ලියකියවිලි සොයා බලා ඒවා නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ස) එක් පාරිභෝගිකයෙකුගෙන් ලැබුණු රු. මිලියන 2.08 ක මුදලක් වෙනත් පාරිභෝගික ගිණුමකට වැරදි ලෙස සටහන් කර තිබුණි. | මෙම ශේෂය 2021 වර්ෂයේදී දැනටමත් නිවැරදි කර ඇත. | පාරිභෝගිකයන්ගෙන් ලැබීම් සටහන් කිරීමේදී අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම. |

| | | |
|---|---|---|
| (හ) ආදායම් ප්‍රකාශනයට අය කිරීම වෙනුවට රු. මිලියන 1.25 ක ණය සැකසුම් ගාස්තුවක් ණය ශේෂයට අය කර තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය සහ ණය ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් රු. බිලියන පහක ණය පහසුකම, නිදහස් කරන ලද මුදලින් සැකසුම් ගාස්තුව පමණක් අඩු කිරීමෙන් අනතුරුව 2020.12.31 දිනට මුදල් ප්‍රකාශනවල රු. 4,998,750,000ක් ලෙස සටහන් කර ඇත. මෙය 2021 අප්‍රේල් මස ගිණුම්වල නිවැරදි කර ඇත. | ගණුදෙනු සටහන් කිරීමේදී අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. මිලියන 753.61 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබියදීත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ගැටලුව නිරවුල් කර නොතිබුණි. | ඉහත ශේෂය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) වෙත ගෙවිය යුතු මුදලක් ලෙස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති අතර එය CPC වෙතද දන්වා ඇත. කෙසේ වෙතත්, CPC විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල මණ්ඩලයෙන් ලැබිය යුතු පොලිය ලෙස පෙන්වා ඇති අතර ඒ සඳහා මණ්ඩලය එකඟ නොවේ. එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා CPC, මණ්ඩලය, භාණ්ඩාගාරය සහ විදුලිබල අමාත්‍යාංශයේ නියෝජිතයින් සමඟ රැස්වීමක් සංවිධානය කිරීමට විදුලිබල අමාත්‍යාංශයේ පැවති විගණන කමිටු රැස්වීමේදී තීරණයක් ගෙන තිබේ. | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර ගැටලුව විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) බිල්පත් ක්‍රමයේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවලද යම් යම් ශේෂයන් මඟහැරීම හේතුවෙන් බෙදාහැරීම් අංශ 01, 02, 03 සහ 04 හි බිල්පත් ක්‍රමයේ දක්වා ඇති 2020 දෙසැම්බර් 31 දිනට තොග වෙළඳ ණයගැතියන්ගේ ශේෂයන් සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අනුරූප ශේෂයන් අතර එකතුව රු. මිලියන 41.18 ක් වූ නොසැසඳු වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, 2012 වසරේ සිට හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ශේෂයක් පවතී. | ණය ගැතියන්ගේ සැසඳීම් සියලු බෙදාහැරීම් අංශ විසින් සකස් කර ප්‍රාදේශීය පිටපත් සමඟ ඉදිරිපත් කරයි. | සෑම අංශයකම සහ සෑම මාසයකම පද්ධති ශේෂයන් සමඟ ලෙජර ශේෂයන් සංසන්දනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ලෙජර් ගිණුමේ හර සහ බැර වශයෙන් පවතින රු. මිලියන 2,343 ක සහ රු. මිලියන 149 ක ශේෂය සංසන්ධනය කිරීම | සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍ර කඩඉම් දිනය මූල්‍ය ගිණුම් කඩඉම් දිනයෙන් බැහැර වීම හේතුවෙන් මෙම වෙනස්කම් ඇති වේ. එබැවින් සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍ර කඩඉම් දිනය මූල්‍ය වර්ෂයේ කඩඉම් දිනය හා සමාන කිරීමට | සෑම අංශයකම සහ සෑම මාසයකම පද්ධති ශේෂයන් සමඟ ලෙජර ශේෂයන් සංසන්දනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා, එකතු කිරීමේ පාලන ගිණුමේ ඇති ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2021 වර්ෂයෙදී ක්‍රියා කර ඇත. | ගැනීම. |
| (ඇ) ශේෂයේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා රු. මිලියන 117.58 ක අවිනිශ්චිත ශේෂයට අදාළ විස්තරාත්මක ලේඛනයක් සහ වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | වෙළඳ ණය ගැතියන් සම්බන්ධ තොරතුරු පද්ධතිය හරහා ජනනය වේ. කෙසේ වෙතත්, දැනට පවතින ක්‍රමය මගින් අවිනිශ්චිත ශේෂයන් සඳහා වයස් විශ්ලේෂණයකට පහසුකම් සපයා නොමැත. එබැවින්, බෙදාහැරීමේ අංශය 2 සහ 4 වයස් විශ්ලේෂණය අතින් සකස් කරන අතර එය අපහසු ක්‍රියාවලියකි. එබැවින්, අනාගතයේ දී අවිනිශ්චිත ශේෂය සඳහා වයස් විශ්ලේෂණයක් සංවර්ධනය කිරීමට කටයුතු කරනු ඇත. | අවිනිශ්චිත ශේෂය සඳහා වයස් විශ්ලේෂණයක් සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඉ) මණ්ඩලය විසින් පාරිභෝගිකයකු සඳහා වැරදි ගාස්තු ක්‍රමයක් යෙදීම හේතුවෙන් 2019 සිට රු. මිලියන 38.76 ක් අයවිය යුතුව පවතී. | තවමත් ක්‍රියාත්මක වන ගැටලුව විසඳීමට කමිටුවක් පත් කර ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඊ) ස්වාධීන තාප බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවිය යුතු මුදලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය සහ නොපිය වූ සහතික කළ ඉන්වොයිසිවල එකතුව අතර රු. බිලියන 5.6 ක වෙනසක් නිරීක්ෂණය විය. | L5806- 'තාප විදුලිය සඳහා ගෙවිය යුතු - ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ (IPP)' ගිණුම 2020 වර්ෂයේදී L-5920 'උපචිත' ගිණුමෙන් ලබාගත් කොටසකි. IPP තාප බලාගාරවලින් එක් එක් මාසය සඳහා ලැබුණු ඉන්වොයිස් අගයන් භාවිතා කරමින් ගිණුම්ගත කර ඇති උපචිත ශේෂය මෙම ශේෂය මගින් පෙන්වයි. මෙම ශේෂයන් ගෙවීම සහතික කරන අවස්ථාවේදී ගලපනු ලැබේ. මෙම වැඩිපුර / අඩුවෙන් ගිණුම්ගත කර ඇති උපචිත ශේෂය ගෙවීමේදී ආපසු හරවනු ලැබේ. ආපසු හැරවීමට ඇති 2020 වසර අවසානයේ දී ලෙජර ශේෂය සහ සහතික කළ හිඟ ඉන්වොයිස් එකතුව අතර රු. බිලියන 5.6 ක වෙනසක් ඇත.<br>කෙසේ වෙතත්, 2021 ජනවාරි මාසයේ සිට, ඉන්වොයිසි කල් ඇතිව සහතික කිරීමට කටයුතු සම්පාදනය කර ඇති අතර එමගින් සහතික කළ අගයන් භාවිතා කර ගෙවිය යුතු මුදල ගිණුම්ගත කර හැකිය. එබැවින් ඉදිරියේදී ශේෂයන් දෙකක අතර වෙනසක් සිදු නොවනු ඇත. | නිවැරදි ගෙවිය යුතු ශේෂය ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (උ) ශුද්ධ ගිණුම්කරණය යටතේ සූර්ය බලශක්තිය මිලදී ගැනීම සම්බන්ධයෙන් cebinfo පද්ධතිය මගින් පවත්වාගෙන යනු වාර්තාවල දැක්වෙන ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු. මිලියන 20.7 ක වෙනසක් නිරීක්ෂණය විය. | බිල්පත් සාරාංශවල ඇති තොරතුරු මත පදනම්ව ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් වියදම් හඳුනා ගැනේ. ඒ අනුව, බලශක්තිය මිලදී ගැනීම සම්ප්‍රේෂණ අංශයේ වගකීමක් වන බැවින් පළාතේ ගණකාධිකාරී (ආදායම්) අදාළ වියදම් සම්ප්‍රේෂණ අංශය වෙත මාරු කරයි. විගණකවරුන් විසින් යොමු කරන ලද PUCSL වාර්තාව, පළාත් දත්ත ලබා ගත නොහැකි සමස්ථ මණ්ඩලයේ තොරතුරු සැපයීම සඳහා නිර්මාණය කරන ලද වාර්තාවකි. එබැවින් | අදාළ වාර්තාවේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඌ) නෙට් ප්ලස් යටතේ සූර්ය | | |

| | | |
|---|---|---|
| බලශක්තිය මිලදී ගැනීම සම්බන්ධයෙන් cebinfo පද්ධතිය මගින් පවත්වාගෙන යනු වාර්තාවල දැක්වෙන ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු. මිලියන 100 ක වෙනසක් නිරීක්ෂණය විය. | යොමු කරන ලද වාර්තාවේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |

**1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය සහ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි. විගණන නියදි පරීක්ෂණවලදී, එවැනි දීමනා එකතුව රු. මිලියන 1,544.4 ක් සහ රු. මිලියන 1,712 ක් පිළිවෙලින් 2020 සහ 2019 වර්ෂයන්හිදී ගෙවා තිබුණු බව හෙළිදරව් විය. | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල ලැයිස්තුගත කර ඇත. *12 (m) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සැකසීම* *12 (n) වගන්තිය: අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව එහි ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට* ඒ අනුව, ආයතනයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම සඳහා ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් සඳහන් කරන ලද නිරීක්ෂණ සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම පනත මගින්ම සපයයි. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල වීම. |
| (ආ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දීම වෙනුවට මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ මෙම ණය ලබා දී තිබුණි. තවද, මණ්ඩලය දැඩි ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී සිටියේදීත් කිසිදු පාලනයකින් තොරව කාර්ය මණ්ඩල ණය ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල ලැයිස්තුගත කර ඇත. *12 (m) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සැකසීම* *12 (n) වගන්තිය: අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව එහි ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට* ඒ අනුව, ආයතනයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම සඳහා ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් සඳහන් කරන ලද නිරීක්ෂණ සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම පනත මගින්ම සපයයි. | කාර්ය මණ්ඩලයට ණය ගෙවීමේදී චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල වීම හෝ කිසියම් විචලනයක් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබා ගැනීම. |

(ඇ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබූ අතර, 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මඟින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,613 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොලිය රු. මිලියන 6,731.90 ක් විය.

සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 3 (1) (ඇ), අංක 4 (1) (ඇ) සහ අංක 30 වගන්තියට අනුව, PUCSL විසින් විදුලි ගාස්තු සකස් කළ යුතුය. කෙසේ වෙතත් 2013 දී සහ 2014 දී ගලපන ලද පවත්නා විදුලි ගාස්තු මඟින් මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් මුදල් උත්පාදනය නොවේ. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ;

3 (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය වියයුත්තේ ශ්‍රී ලංකාව තුළ විදුලි කර්මාන්තය සඳහා ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂණ නියාමක වශයෙන් ක්‍රියා කිරීම සහ

(ඇ) ස්වකීය පාරිභෝගිකයින්ට වඩාත් ලාභදායක සහ කාර්යක්ෂම සේවයක් ලබාදීම සහතික කිරීමේ අරමුණින් බලපත්‍රලාභීන් හා වෙනත් විදුලිබල ව්‍යාපාරවලින් අය කරනු ලබන ගාස්තු සහ වෙනත් අයකිරීම් නියාමනය කිරීම;

30 (1) වගන්තිය -

(අ) විදුලි බලය සම්ප්‍රේෂණය කිරීම හා තොග විකිණීම සඳහා සම්ප්‍රේෂණ කිරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයක්‍රම හෝ ගාස්තු (මෙතැන් සිට ''සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයක්‍රම'' ලෙස හැඳින්වේ); සහ

(ආ) විදුලි බලය බෙදා හැරීම හා සැපයීම සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයක්‍රම හෝ ගාස්තු (මෙතැන් සිට ''බෙදාහැරීමේ හා සැපයීමේ අයක්‍රම'' ලෙස හැඳින්වේ);

සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(2) සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයක්‍රම සහ බෙදා හැරීමේ හා සැපයීමේ අයක්‍රම අදාළ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව -

(අ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය ප්‍රත්‍යවේක්ෂක ක්‍රමවේදයකට අනුකූලව අදාළ බලපත්‍රලාභියා විසින් සකස් කරනු ලැබිය යුතු ය;

(ආ) කාර්යක්ෂම පදනමක් මත, එහි බලපත්‍රය මඟින් බලය දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාමේදී දරන ලද සියලු සාධාරණ වියදම්, ආපසු අයකර ගැනීම සඳහා අදාළ බලපත්‍රලාභියාට අවසර දෙනු ලැබිය යුතු ය;

පනතේ විධිවිධානයේ අවශ්‍යතාවලට අනුකූල වීම.

(ඇ) 5 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ප්‍රකාර කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය; තවද

(ඈ) මහජනතාවගේ දැනගැනීම සහතික කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට ප්‍රකාශයට පත් කළ යුතු ය.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 28 (3) වගන්තියට අනුව සෑම බෙදාහැරීමේ බලපත්‍රයක්ම සිය ගනුදෙනුකරුවන්ට සුරැකුම් තැන්පතු සඳහා පොළිය ගෙවිය යුතුය. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ.

28 (3) වගන්තිය "ඇප මුදලක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් බෙදා හැරීමේ බලපත්‍රලාභියෙකු වෙත තැන්පත් කරනු ලැබූ අවස්ථාවක ඒ මුදල ඒ බලපත්‍රලාභියා සතුව පවත්නා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව බලපත්‍රලාභියා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් අනුපාතයකට අනුව බලපත්‍රලාභියා විසින් ඒ මුදල් ප්‍රමාණය මත පොලියක් ගෙවනු ලැබිය යුතුය."

වර්තමානයේදී මණ්ඩලය වෙත සිය ව්‍යාපාරය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් මුදල් නොලැබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය විසින් සිය ගනුදෙනුකරුවන්ගේ සුරැකුම් තැන්පතු සිය කාරක ප්‍රාග්ධනයේ කොටසක් ලෙස භාවිතා කරන අතර අවශේෂ කාරක ප්‍රාග්ධනය බැංකු අයිරා, කෙටිකාලීන ණය ආදියෙන් ලබා ගනී.

මණ්ඩලය විසින් සිය ගනුදෙනුකරුවන්ගේ සුරැකුම් තැන්පතු එහි කාරක ප්‍රාග්ධනය ලෙස භාවිතා කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිලාභ, එනම් බැංකු අයිරා මත පොළිය ඉතිරි වීම, ගාස්තු අඩු කිරීම මගින් සියළුම පාරිභෝගිකයින් අතර බෙදා හරිනු ලැබේ. මෙම වගන්තියට අනුව බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සුරැකුම් තැන්පතු සඳහා පොළිය ගෙවීමට යන්නේ නම් එය බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා අමතර මූල්‍ය බරක් වන අතර කර්මාන්තයට අමතර පිරිවැයක් වනු ඇත.

එබැවින්, 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 28 (3) වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කිරීමට අප විසින් අමාත්‍යාංශය වෙත

| | | |
|---|---|---|
| | නිර්දේශ කර ඇත. තවද, මණ්ඩලය විසින් 2021-05-28 දිනැති අංක : DGM(CS&RA)/GEN/1 දරන PCSELR (නීති සහ රෙගුලාසි සරල කිරීමේ පිළිබඳ ජනාධිපති කොමිසම) කොමිසමේ ලේකම් වෙත පිටපතක් සහිතව විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද ලිපිය මගින් මණ්ඩලය දැනට පවතින 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 28 (3) වගන්තිය ඉවත් කරන ලෙස ඉල්ලා ඇත. | |

**1.5.6 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදි. | | |
| (අ) සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම (**LCC**) | | |
| i. ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (එල්.කේ.ඒ.එස් 12) හි 88 වන ඡේදයට අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තුවට (ඊ.එස්.සී) අදාළ රු. 159,549,619 ක තක්සේරුව සහ ඊට අදාළව පනවන ලද රු. 75,461,644 ක දඩ සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව්වක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි. තවද, සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 6 වැනි වගන්තියට අනුව, ඊ.එස්.සී වගකීම කාර්තුව අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ විසිවන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා සමාගම විසින් ගෙවිය යුතු මුළු ඊ.එස්.සී මුදල වූ රු. 579,179,232 ක් ගෙවා නොතිබුණි. | ඊ.එස්.සී පියවීමට කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවා ඇති අතර, ඊ.එස්.සී පියවීමට සුහද ගිවිසුමක් ඇති කර ගන්නා තෙක් සමාගමට එරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයකින් හෝ දඩ අයකිරීමකින් වළකින ලෙසද ඉල්ලීමක් කර ඇත. | දඩ වළක්වා ගැනීම සඳහා නියමිත දිනට පෙර වගකීම් පියවීම. |

| | | | |
|---|---|---|---|
| ii. | මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 12,073,788 ක මුදලක්, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 2,559,819 ක හර ශේෂයක් සහ 2020.01.01 දිනට රු. 4,674,041 ක ආරම්භක ශේෂයක් පැවති අවිනිශ්චිත ගිණුමක ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ඉහත සඳහන් අවිනිශ්චිත ගිණුමට කිසිදු හේතුවක් නොමැතිව රු. 1,594,325 ක මුදලක් හර කර තිබුණු අතර රු. 3,708,547 ක මුදලක් බැර කර තිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තාවල හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා මෙම සටහන් සිදු කර ඇත. | අවිනිශ්චිත ගිණුමේ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| iii. | ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනකමට එකතු කරන ලදි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. 3,653,155,934 ක් වූ සියයට 10 ක අංකිත මිල ආදායමට එකතු කර තිබූ අතර පසුව සමාගම විසින් ණයගැතියන්ට එය වට්ටමක් ලෙස ලබා දී විකුණුම් පිරිවැයට අය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | මණ්ඩලය වෙත වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේදී රේගු ආන්තිකය පිරිවැයට එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් LCC වෙත නියෝගයක් ලබා දෙන ලදි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය සම්මත කරන ලදි. IRD නිලධාරියා මණ්ඩලයට ලැබෙන ඉන්වොයිසි මත LCC හි වැට් බද්ද සඳහා වන මූලික අගය රේගු අරමුණු සඳහා වන අගයට වඩා අඩු විය නොහැකි බව පවසා ඇත. එබැවින් සියයට 10 එකතු කරනු ලබන්නේ IR නිලධාරියාගේ නියෝගය මත පමණි. එතැන් සිට මණ්ඩලය මෙම නියෝගය අභියෝගයට ලක් කර ඔවුන්ගේ 2018-09-07 දිනැති ලිපිය මගින් IR වෙත ලියා ඇති අතර එයට ප්‍රතිචාරය තවමත් ලැබී නොමැත. එතෙක් අපි ඉන්වොයිසියට සියයට 10 රේගු ආන්තිකය එකතු කළ නමුත් කිසියම් අතිරික්ත නිමැවුම් වැට් බද්ධක් IRD වෙත ප්‍රේෂණය නොකරනු ඇත. ආදායමේ අන්තර්ගතය වන සියයට 10 ක සංකල්පීය ආන්තිකය ඉවත් කර නිමැවුම් වැට් බද්ද ගණනය කිරීමේ හැකියාව පිළිබඳව LCC දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවලට අනුකූලව වාර්තා පවත්වාගෙන යාම. |
| iv. | 2020.12.31 දිනට රු. 10,624,394 ක් වූ දිගු කාලීනව හිඟ ලැබිය යුතු කළමනාකරණ ගාස්තු සඳහා කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සමාගම විසින් සලසා නොතිබුණි. | එල්.සී.සී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් ලබා ගැනීමෙන් පසුව ගැටළුව විසඳනු ඇත. | හිඟ කළමණාකරණ ගාස්තු ආපසු අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කර සුදුසු හානිකරණ ප්‍රතිපාදන සැලසීම. |

| | | | |
|---|---|---|---|
| v. | 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. 205,000,000 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට විසින් පනවා තිබුණි. 2019 දී ගෙවන ලද දඩ මුදල වැරදි සහගත ලෙස ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට රු. 158, 186,165 ක්, වැට් පාලන ගිණුමට රු. 39,970,418 ක් සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට රු. 6,843,417 ක් හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රඳවා ගත් ඉපැයීම්වල ආරම්භක ශේෂය රු. 205,000,000 කින් සහ වත්කම් රු. 198,156,583 කින් වැඩියෙන් දැක්වුණු අතර වගකීම් රු. 6,843,417 කින් අඩුවෙන් දැක්වුණි.<br>නැව්ගත කිරීමේ බිල්පත් පියවීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු අරමුදල්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව රු. 205,000,000 ක දඩය ගෙවීමට සමාගම භාවිතා කර ඇති අතර මෙම අලාභයට වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු අගයන් ප්‍රකාශනය කර නොමැත. එම කාලය තුළ, ලංකා නැව් සංස්ථාව (CSC) විසින් එක් නැව්ගත කිරීමකට රු. 1,000,000 ක ගාස්තුවක් යටතේ රේගු ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හසුරුවා ඇති අතර ඉහත වැරදි ප්‍රකාශනය මත ශ්‍රී ලංකා රේගුව LCC වෙත රු. 205,000,000 ක රාජසන්තක කිරීමක් පනවා තිබුණි. මෙම ගෙවීමෙන් පසු අවසන් වැට් බදු ගෙවීමක් නොමැති බව ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් LCC නිලධාරීන්ට දන්වා තිබුණි.<br>ඒ වන විට LCC විසින් ඉහත අදාළ නැව්ගත තොග සඳහා අවසන් වැට් බද්ද ලෙස රු. 37,594,744 ක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා තිබූ අතර ශ්‍රී ලංකා රේගුව විසින් ගල් අඟුරු නැව්ගත තොග නිෂ්කාශනය කිරීම රඳවාගෙන තිබූ හෙයින් පසුව මණ්ඩලය විසින් CSC හිඟ පියවීමට ලබාදුන් අරමුදල් යොදා ගනිමින් රු. මිලියන 205 ක මුදල පියවීමට LCC ආයතනයට සිදු විය. | මෙම අලාභයට වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම. |
| vi. | සී/ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා සී/ස ටෝරියන් යකඩ හා වානේ සමාගමෙන් (ටී.අයි.එස්.සී.එල්) රු. 539,192,079 ක දිගු කාලීනව හිඟ ලැබිය යුතු ශේෂය අය කර ගැනීමට කටයුතු කිරීමට සමාගම අසමත් වී තිබුණි. 2020.12.31 දිනට ලංකා නැව් සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශනවල ඉහත ශේෂය ගිණුම් ගත කර නොතිබුණි. ටී.අයි.එස්.සී.එල්/සී.එස්.සී.එල් විසින් මෙම ශේෂය තහවුරු කර හෝ හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා හෝ | ටෝරියන් යකඩ සහ වානේ බේරුම්කරණය ඉහළ මට්ටමේ කමිටුවක් විසින් හසුරුවන ලදි. ණය බෝල් ණය බව කමිටුවේ මතය වී නොමැති අතර ගල් අඟුරු සැපයීම හරහා ගෙවිය යුතු මුදල් පියවීමට ගැණුම්කරු පවා කැමැත්ත පළ කර ඇත. අප සතුව ඇති තොරතුරුවලට අනුව, බේරුම්කරණ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇත.<br>ලංකා නැව් සංස්ථාව (සී/ස ටෝරියන් යකඩ සහ වානේ සමාගම) වෙතින් ලැබිය යුතු හිඟ මුදල්වල වර්තමාන තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර අමාත්‍ය මණ්ඩලය විසින් ටෝරියන් යකඩ හා වානේ සමාගම සමඟ සාකච්ඡා කිරීමට භාණ්ඩාගාරය (සභාපති), ලංකා | දිගුකාලීන හිඟ ශේෂය අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. එම නිසා, ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය සහ ලංකා ගල් අඟුරු සමාගම නියෝජනය වන සිව් පුද්ගල කමිටුවක් පත් කරන ලදි. තවද, ඉදිරිපත් කිරීමට නියමිත එම කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසද අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇත. | |
| vii. | මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 578,678,686 ක් වූ ඊ.එස්.සී ශේෂය, විවිධ ණයගැතියන්ගෙන් රු. 18,075,801 ක්, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පී.ටී.ඊ ලිමිටඩ් හි රු. 1,115,987 ක ලැබිය යුතු දෑ, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පී.ටී.ඊ ලිමිටඩ් හි රු.85,887,776 ක වෙළඳ ණය හිමියන් සහ ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන රු. 8,048,531 ක් තහවුරු කිරීමට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි. | i.මණ්ඩලය වෙතින් ලැබිය යුතු ඊ.එස්.සී : රු. 578,678,686<br>ඊ.එස්.සී පියවීම දීර්ඝ කරන ලෙස ඉල්ලමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවා ඇත.<br>ii.විවිධ ණයගැතියන් - රු. 18,075,802<br>රු. 17,839,949 ක් වූ ආපසු අයකරගත නොහැකි NBT සහ PAL වලින් එම මුදල සමන්විත වන බව මූලික විමර්ශනවලින් හෙළි විය. මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.<br>iii. නෝබල් රිසෝසස් වෙතින් ලැබිය යුතු - රු.1,115,987<br>නෝබල් රිසෝසස් සඳහා රු. 85,887,776 ක ණය ශේෂයක් ඇති අතර අපි මෙම ණයගැති ශේෂය ඊට එරෙහිව පියවනු ඇත.<br>iv. නෝබල් රිසෝසස් වෙළඳ ණයහිමියන් - රු.85, 887,776<br>ණයවර ලිපි වලංගු කාලය අවසන් වීම හේතුවෙන් නෝබල් රිසෝසස් ඉන්ටනැ. (පුද්.) සමාගම විසින් අඩුවෙන් ලබා ගන්නා ලද මුදලකින් මෙය ප්‍රධාන වශයෙන් සමන්විත වේ.<br>v. ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 - රු. 8,048,531<br>2015/16 වාරයට අදාළ නැව් 17 ක් සඳහා ගොඩබෑමේ වරායේ Draft Survey ගාස්තු මේ තුළ ඇතුළත් වේ. අත්සන් කරන ලද ගිවිසුම මත පදනම්ව මෙම ගෙවීම සිදු කරන ලෙස ලිබර්ටි කොමඩිටීස් පී.ටී.ඊ ලිමිටඩ් වෙත දන්වමින් 2019 දී විද්‍යුත් තැපැලක් යවන ලදි. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | එකී ශේෂයන්ට අදාළ ලිපි ලේඛන පවත්වාගෙන යෑම. |
| viii. | ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ප්‍රවාහන ගාස්තු හා වැට් බදු සඳහා මණ්ඩලය විසින් ගෙවන ලද රු. 285,375,105 ක් වෙන වෙනම | LCC හි පවතින ගිණුම්කරණ ක්‍රමවලට අනුව එක් එක් ගල් අඟුරු වාරය සඳහා ගිණුම්කරණය සිදු කෙරේ. 2020-21 වාරය සඳහා ලැබිය යුතු ශුද්ධ අගය 2020 දෙසැම්බර් 31 දිනට | ලද අත්තිකාරම් වෙන වෙනම හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| හෙළිදරව් කිරීමෙන් තොරව, එය "තාප ගල් අඟුරු නැව්ගත තොගය සඳහා වෙළඳ ණය ගැතියන් (සී.ට්.බී)" ගිණුමෙන් අඩු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "තාප ගල් අඟුරු නැව්ගත තොගය සඳහා වෙළඳ ණය ගැතියන් (සී.ට්.බී)" සහ මණ්ඩලයෙන් ලැබුණු අත්තිකාරම් රු. මිලියන 285.37 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. | මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂය ලෙස දැක්වේ.<br><br>විගණනයෙන් පෙන්වා ඇති පරිදි වසර අවසානයේ ලැබිය යුතු ශුද්ධ ශේෂය හෙළිදරව් කර ඇති නමුත් මණ්ඩලයෙන් ලැබිය යුතු මුළු මුදල සහ ලැබුණු අත්තිකාරම් වෙන වෙනම අනාවරණය කර නොමැත. ලැබුණු අත්තිකාරම් ලබන වසරේ මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වේ. | |
| ix. මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් නොමැතිව සමාගම 2019 දී සී/ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා මර්කේටර් සිංගප්පූර් ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු. 4,000,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් මෙම මුදල සී.එස්.සී.එල් ගෙවිය යුතු ශේෂයට වැරදි ලෙස අඩු කර තිබුණි. එම නිසා, වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | මෙම ගෙවීම 2019 වර්ෂයේදී සී/ස ලංකා නැව් සංස්ථාව (CSC) හරහා මර්කේටර් සිංගප්පූර් ප්‍රයිවට් ලිමිටඩ් වෙත සිදු කර ඇති අතර මර්කේටර් වගකීමේ මූලාශ්‍රය/සම්භවය සොයා බැලීම සඳහා විමර්ශනය කෙරෙන අතර ඒ අනුව CSC වෙත අදාළ සටහන් යොදනු ඇත. | මර්කේටර් සිංගප්පූර් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවීමේ මූලාශ්‍රය/සම්භවය සොයා බැලීම සඳහා විමර්ශනයක් කිරීම. |
| x. මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020.12.31 දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු අවසන් වැට් බද්ද සහ වෙනත් ලැබිය යුතු දෑ හා වෙළඳ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. 197,452,711 ක් සහ රු. 12,073,788 ක් විය. කෙසේ වෙතත්, එය මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. එම නිසා, විගණනය සඳහා කිසිදු සාක්ෂියක් නොතිබූ හෙයින් වෙළඳ ණයගැති ශේෂයේ නිවැරදි භාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | අවසාන වැට් බද්ද සහ මණ්ඩලයෙන් ලැබිය යුතු වෙනත් රු.197,452,711 :<br>ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශ කර නොමැත. රේගු නිලධාරීන්ගේ උපදෙස් පරිදි LCC සහ මණ්ඩලයේ නිලධාරීන් විසින් ගෙවිය යුතු වැට් බද්ද ගණනය කර ඇති අතර එහිදී 123 සිට 154 දක්වා නැව්ගත තොගයන් සඳහා රු. 195,780,909 ක් ගෙවිය යුතුය. ඊට අමතරව එම නැව්ගත තොගවලට අදාළ විනිමය අලාභය සඳහා රු. 1,671,802 ක් ගෙවන ලෙස LCC ඉල්ලා සිටියේය. වර්තමානයේදී, ඉහත ගෙවිය යුතු වැට් බදු ශේෂය අනාගත පියවීම් සඳහා තවදුරටත් විශ්ලේෂණය කෙරේ.<br>වෙළඳ ණයගැතියන්ගේ (මණ්ඩලය) විස්තර - බොයිලේරු ගල් අඟුරු රු. 12,073,788 පහත දැක්වේ.<br>• මණ්ඩලය වෙතින් ලැබිය යුතු රු.2,563,287 : 2017 දී මණ්ඩලය සමග ගිණුම පියවීමෙන් පසු ඉතිරිව ඇති මුදල. මූලාශ්‍රය/සම්භවය නිශ්චය කර ගැනීම | එම ශේෂයන්ට අදාළ ලිපි ලේඛන පවත්වාගෙන යාම සහ මණ්ඩලය වෙතින් තහවුරු කිරීම් කැඳවීම. |

| | | |
|---|---|---|
| | සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.<br>• වෙළඳ ණයගැතියා (මණ්ඩලය) බොයිලේරු ගල් අඟුරු රු. 7,750,000 : මණ්ඩලය වෙනුවෙන් මර්කේටර් වෙත ගෙවන ලද මුදල. මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීමට සලකා බලනු ලැබේ.<br>• මණ්ඩලයෙන් ලැබිය යුතු වෙනත් රු.1,760,500 : 2017 දී මණ්ඩලය සමග ගිණුම පියවීමෙන් පසු ඉතිරිව ඇති මුදල. මූලාශය/සම්භවය නිශ්චය කර ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ. | |
| xi. සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. 136,236,370 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව තථ්‍ය වැට් බදු මුදල රු. 106,969,404 ක් විය. එම නිසා, වැඩිපුර ගෙවන ලද මුදල රු. 29,266,965 ක් විය. | රු. 29,266,965 ක වැඩිපුර ගෙවීම සඳහා පහත ලියකියවිලි ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කරන ලදි.<br>• Mv.Star Lutas හි 2016/11/09 දින අවසන් රේගු ප්‍රකාශනය (Custom Declaration) 1183769<br>• අවසාන වැට් බදු ගණනය කිරීම<br>• 2021 පෙබරවාරි 10 දිනැති නවතම රේගු මුදල් ආපසු ගෙවීමේ ලිපියේ පිටපත. | වැඩිපුර ගෙවීම ආපසු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්ගලික) සමාගම (SLE) | | |
| (i) තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 02) 37 වැනි ඡේදයට අනුව, ආයතනයක් විසින් විවිධ වර්ගීකරණයන් යටතේ ඇති තොගවල ධාරණ අගය පිළිබඳ තොරතුරු අනාවරණය කළ යුතු අතර මෙම වත්කම්වල වෙනස්වීම්වල ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන භාවිත කරන්නන්ට ප්‍රයෝජනවත් වේ. කෙසේ වෙතත්, ආයතනය තොගවල විවිධ වර්ගීකරණයන් අනාවරණය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන යටතේ දක්වා ඇති තොගවල අගය SLE හි මීටර් ආවරණ නිෂ්පාදනයට සම්බන්ධ වන අතර අමුද්‍රව්‍යවල වටිනාකම්, කෙරීගෙන යන වැඩ සහ සම්පූර්ණ කරන ලද මීටර් ආවරණ නිෂ්පාදනවල වටිනාකමෙන් මෙම අගය මූලික වශයෙන් සමන්විත වේ. මෙය සවිස්තරාත්මක වන අතර ඊළඟ වතාවේ සිට හොඳම පරිචයට අනුගත වනු ඇත. | පනතේ අවශ්‍යතාවයට අනුකූල වීම. |
| (ii) එල්.කේ.ඒ.එස් 12, ආදායම් බදු ප්‍රමිතියේ අංක 80 (අ) ඡේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල සටහනේ ආදායම් බදු වියදම් පිළිබඳ හෙළිදරව් කිරීම්වල ආදායම් බදු ප්‍රතිපාදන පිළිබඳ විස්තර සටහන් කර නොතිබුණි. | ආදායම් බදු ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු ඉදිරියේදී සැපයීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ආදායම් බදු ප්‍රතිපාදන පිළිබඳ විස්තර සැපයීම. |

| | | |
|---|---|---|
| (iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (එල්.කේ.ඒ.එස්) 38 - අස්පෘශ්‍ය වත්කම්වල 118 (අ) සහ (ආ) ඡේදයට අනුව, ආයතනයක් ප්‍රයෝජනවත් ජීවිත කාලය අවිනිශ්චිතද හෝ නිශ්චිතද යන්න සහ නිශ්චිත නම්, ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ භාවිතා කරන ලද ක්‍රමක්ෂය අනුපාතය සහ නිශ්චිත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා භාවිතා කරන ක්‍රමක්ෂය ක්‍රමය හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් ඉදිරිපත් කර නොතිබුණි. | අනාගතයේදී මෙම හොඳම පරිචයට අනුගත වනු ඇත. | ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූල වීම. |
| (iv) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 07, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ, ලැබිය යුතු රඳවා ගැනීමේ බදු මුදල ලෙස රු. 2,120,524 ක් දක්වා ඇත. රඳවා ගැනීමේ බදු සහතිකයේ මුල් පිටපත විගණනයට පරීක්ෂාව සඳහා ලැබී නොතිබුණි. | අනාගතයේදී මෙම හොඳම පරිචයට අනුගත වනු ඇත. | නියමිත වේලාවට විගණනයට අවශ්‍ය ලියකියවිලි ලබා දීම. |
| (v) සමාගම 2020 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් සඳහා සභාපති දීමනා ලෙස රු. 187,500 ක් උපචිත කර නොතිබුණි. | සභාපතිවරයා සඳහා මාසික දීමනාව 2020 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් සඳහා ගෙවා ඇති අතර එය වැරදි සහගත ලෙස පරිපාලන වියදම්වල වැටුප් යටතේ සටහන් කර ඇති බවට දෝෂයක් හඳුනාගෙන ඇත. වාර්තා තබා ගැනීමේදී මෙම දෝෂ මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය දේ ගැන අවධානය යොමු කරනු ඇත. | එවැනි වැරදි වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (vi) මාරුකිරීම් ID 1944619, 1944620, 1956018 සහ 1956014 ට අදාළව රු.13,861,600 ක් සඳහා ලේඛන සාක්ෂි සපයා නොතිබුණි. | සෑම ගෙවීමක්ම නිසි ලෙස අනුමත ලියකියවිලි සමඟ සිදු කරන ලද අතර, එක් එක් ගෙවීම් දිනයන් සහ අගයන් සවිස්තරාත්මකව සැපයිය හැකි නම්, අපට මෙම සැකය සොයා ගැනීමට හැකි වනු ඇත. | නියමිත වේලාවට විගණනයට අවශ්‍ය ලියකියවිලි ලබා දීම. |
| (vii) එල්.කේ.ඒ.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ ප්‍රමිතය අනුව; සමාගම විසින් සම්පූර්ණයෙන් | අනාගතයේදී මෙම හොඳම පරිචයට අනුගත වනු ඇත. | ප්‍රමිතියේ අවශ්‍යතා වලට අනුකූල වීම. |

| | | | |
|---|---|---|---|
| | ක්ෂය වූ වත්කම් අනාවරණය කර නොතිබූ අතර එහි මිලදී ගැනීමේ පිරිවැය රු.9,573,376 කි. | | |
| (viii) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවතී රු. 2,218,582 ක අවිනිශ්චිත ශේෂය සමාගම විසින් හඳුනා ගෙන නොතිබුණි. | ශේෂය විමර්ශනය කර ඉදිරියේදී විසඳීමට කටයුතු කරනු ඇත. | මෙම කරුණ විමර්ශනය කර විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ix) | 2017 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද සමාලෝචිත වර්ෂය අවසන් දිනට උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 729,992 ක් පියවීමෙන් තොරව පැවතුණි. | මෙය වහා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඇ) | **සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම (ලෙකෝ)** | | |
| (i) | එල්.කේ.ඒ.එස් 1 හි 32 ඡේදය අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් මඟින් අවශ්‍ය වුවහොත් හෝ අවසර දුනහොත් හැර සමාගම වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. කෙසේවෙතත්, | | |
| - | සැපයුම්කරුවන්ගෙන් ලද ප්‍රමාද ගාස්තු රු. 64,314,868 ක් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම්වලට එරෙහිව හිලව් කර තිබුණි. | අනාගතයේ දී මෙම ගාස්තුව වරින් වර උකහා ගනු ලබන අතර මිල දී ගැනීමේ පිරිවැයට එරෙහිව හිලව් කිරීම වෙනුවට වෙනත් ආදායමක් ලෙස ඉදිරිපත් කරනු ඇත. | ප්‍රමිතියේ අවශ්‍යතාවලට අනුකූල වීම. |
| - | රු. 9,174,474 ක් වූ ගනුදෙනුකරුවන්ගේ බැර ශේෂයන් සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලැබිය යුතු දෑවලට එරෙහිව සමාගම විසින් හිලව් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල බැර ශේෂයන් වෙන වෙනම පෙන්වීම ප්‍රායෝගික නොවේ. ණය ගැතියන්ගේ මුළු වටිනාකම හා සසඳන විට බැර ශේෂවල වටිනාකම ප්‍රමාණවත් නොවේ.<br>පාරිභෝගිකයන් විසින් ගෙවනු ලබන සූර්ය ණය වාරික මෙම බැර ශේෂයන් සඳහා ප්‍රධාන හේතුවයි. සූර්ය ණය, ගිවිසුමට අනුව නිශ්චිත දිනවලදී ගෙවිය යුතු නමුත් පාරිභෝගිකයින් එය විවිධ දිනවලදී ගෙවයි. එබැවින්, බිල්පත් පද්ධතියට මෙය හඳුනා ගත නොහැක. මෙම නිශ්චිත දිනවලින් පසුව ගෙවීම් ආකාරය ඇතුළත් කිරීමට අපි පියවර ගනු ඇත.<br>කෙසේ වෙතත්, බැර ශේෂයන් හඳුනාගෙන NSB වෙත ගෙවීම් සිදු කිරීම සඳහා බිල්පත් පද්ධතියෙන් වාර්තා කිහිපයක් ජනනය කිරීමට වරින් වර අවශ්‍ය පියවර ගෙන ඇත. | |

| | | |
|---|---|---|
| - අත්තිකාරම් ගෙවීමේ හර ශේෂය වූ රු. 9,385,853 ක් සමාලෝචිත වර්ෂයේ විවිධ ණය හිමියන් සහ උපචිත වියදම්වලට එරෙහිව හිලව් කර තිබුණි. | 2020.12.31 දිනට පද්ධතියට ඇතුළත් කර නොමැති LC අගයට අදාළ රු. 8,772,473 ක් මෙයට ඇතුළත් වන අතර එබැවින් ණය හිමියන්ගේ හර ශේෂයක් පෙන්වයි. | |
| (ii). මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට නුගේගොඩ, මීගමුව සහ ගාල්ල ශාඛාවල කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩවල ශේෂය පිළිවෙලින් රු. 215,834,467 ක්, රු. 29,970, 666 ක් සහ රු. 77,226,400 ක් විය. කෙසේ වෙතත්, කෙරිගෙන යන ප්‍රාග්ධන කාර්යය වාර්තාවට අනුව, ඉහත සඳහන් ශේෂයන් පිළිවෙලින් රු. 237,329,923 ක්, රු. 35,308,618 ක් සහ රු. 65,301,260 ක් විය. ඒ අනුව, ශේෂයන් අතර පිළිවෙලින් රු. 21,495,456 ක, රු. 5,337,952 ක සහ රු. 11,925,140 ක වෙනස්කම් පැවතුණි. | 2016 දී ප්‍රොන්ටෝ පද්ධතියේ පෙර අනුවාදයෙන් සංක්‍රමණය වූ සමහර සටහන් තිබේ. කාර්යය පිරිවැයකරණ මොඩියුලයේ ඇතැම් කාර්යය සටහන් ද්විගුණනය වී ඇති බව සොයා ගන්නා ලදි. මෙම පරතරයට හේතුව මෙය විය හැකිය. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රොන්ටෝ පද්ධතියේ සේවා සපයන්නා සමඟ මෙම කාරණය පිළිබඳව විමර්ශනය කරයි. | පද්ධතියේ ගැටලුව විසඳීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (iii) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සහ බිල්පත් ක්‍රමයේ දක්වා ඇති ණය ගැති ශේෂය අතර රු. 13,548,574 ක වෙනසක් පැවතුණි. | අදහස් දැක්වීම සටහන් කර ගන්නා ලදි. 2016 වර්ෂයේ පද්ධති සංක්‍රමණය සමඟ ප්‍රොන්ටෝ පද්ධතියේ මෙම ශේෂය දිස්වේ. මෙම කාරණය විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කර ඒ අනුව නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (iv) කාලීන තැන්පතු සහ ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනෙකුත් මූල්‍ය වත්කම් පොලී ආදායම පිළිවෙලින් රු. 136,806,661 කින් සහ රු. 67,972,005 කින් අඩුවෙන් දැක්වුණි. | සටහන් කර ගන්නා ලද අතර 2021 වර්ෂය තුළදී අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ සියලුම පොලී ආදායම හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (v) නුගේගොඩ ශාඛාව මඟින් 2020 දෙසැම්බර් 31 දින සිදු කළ රු. 5,997,445 ක මුදල් තැන්පතුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැංකු අයිරාව ලෙස හඳුනාගෙන තිබුණි. | මෙය 2021 මාර්තු මාසයේ ගිණුම් පොත්වල නිවැරදි කරන ලදි. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| (vi) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට භාවිතා කිරීමේ අයිතිය සතු වත්කම්වල ශේෂය රු. 164,892,477 කි. භාවිතා කිරීමේ අයිතිය සතු වත්කම් ලැයිස්තුව අනුව ඉහත ශේෂය රු. 154,739,719 ක් විය. ඒ අනුව භාවිතා කිරීමේ අයිතිය සතු වත්කම් රු. 10,152,759 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ලෙකෝ විසින් මාසික කුලී පදනම මත ලබාගත් ඉඩම් සහ ගොඩනැගිලි සඳහා අත්සන් කරන ලද කුලී ගිවිසුමට අනුව මෙම භාවිතා කිරීමේ අයිතිය සතු සහ ණය ගැණුම් වගකීම් නිර්මාණය කර ඇත. අපේක්ෂිත කල්බදු කාලසීමාවේ ඇස්තමේන්තුවේ වෙනස වත්මන් වර්ෂයේ සිට පසුගිය වසර දක්වා වෙනස් වීම සහ ශුද්ධ වර්තමාන වටිනාකමේ වෙනස්කම් හේතුවෙන් මෙම ගණනය කිරීමේ පරතරය ඇති වී ඇත. අපි 2021 වර්ෂයේදී ගණනය කිරීම් නැවත පරීක්ෂා කර ගිණුම් පොත්වල අදාළ ගැලපීම් සිදු කරනු ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (vii) සමාලෝචිත වර්ෂයේ ඇන්ටෙ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හි ආදායම් බදු වියදම රු. 6,092,227 ක් විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එය සලකා බලා නොතිබුණි. | අදහස සටහන් කර ගන්නා ලද අතර අවශ්‍ය නම් 2021 වර්ෂයේදී අවශ්‍ය ගැලපීම් කිරීම. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (viii) භාවිතා කිරීමේ අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් රු. 48,719,696 ක් තොග යටතේ ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | භාවිතා කිරීමේ අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් සම්බන්ධ ගිණුම් සටහන් අදාළ පොදු ලේජර ගිණුම් වෙත නිවැරදිව සටහන් කර ඇත. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන අතින් සකස් කිරීමේදී, මෙම පොදු ලේජර කේතයන් තොග ශේෂයට වැරදි ලෙස සිතියම්ගත කර ඇත. අපි 2021 දී මෙම දෝෂය නිවැරදි කරනු ඇත. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ix) 2020 වර්ෂයේ මුල් කාර්තුව සඳහා ආරක්ෂිත තැන්පතු වෙනුවෙන් ලද පොලිය රු. 8,703,024 ක් ආයෝජන සඳහා ලැබිය යුතු පොලී යටතේ වැරදි ලෙස සටහන් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | අවශ්‍ය ගැලපීම් 2021 වර්ෂයේදී සිදු කෙරේ. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (x) 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස් සඳහා කරන ලද රු. මිලියන 5 ක ආයෝජනයට අදාළ කොටස් සහතිකයක් හෝ වෙනත් ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. | ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළද ආයෝජනයට අදාළ කොටස් සහතික සමාගම විසින් ලබා නොදීම නිසා මෙම ශේෂය අයකර ගැනීමට ලෙකෝ නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් පතයි. | කොටස් සහතිකය ලබා ගැනීමට හෝ එම ශේෂය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

### 1.5.7 පරිපාලිත සමාගම්වල අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් (ටී.පී.සී.එල්) හි විගණක එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත සඳහන් කරුණු අවධාරණය කර ඇත.<br><br>සාම්පූර්හි මෙගාවොට් 500 ක ගල් අඟුරු බලාගාරයක් සංවර්ධනය කිරීමේ එකම අරමුණ ඇතිව ක්‍රියාත්මක වූ සමාගම 2016 මුදල් වර්ෂයේදී එම බලාගාරයේ සංවර්ධන කටයුතු නවතා දමා ඇති අතර කලින් ප්‍රාග්ධනිත කළ වියදම් 2018 වර්ෂයේදී කපා හැර ඇත. ඒ වෙනුවට, සාම්පූර්හි ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම සඳහා ලබා දුන් එම ඉඩමේම ටී.පී.සී.එල් විසින් මෙගාවොට් 50 ක සූර්ය විදුලි බලාගාරයක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. තවද, කෙරවලපිටියේ මෙගාවොට් 500 ක එල්.එන්.ජී විදුලි බලාගාරයක් සංවර්ධනය කිරීමට ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වසර අවසානයේදීත් ඉහත විදුලි බලාගාරවල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සිදු කර නොතිබුණි. ඒ අනුව, සමාගමට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් මතු කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් මෙයින් පෙන්නුම් කෙරේ. | 2018 මැයි මාසයේදී මෙගාවොට් 50 ක සූර්ය බලශක්තිය සහ මෙගාවොට් 500 ක එල්එන්ජී බලාගාර සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. සාම්පූර්හි ගල් අඟුරු බලාගාරය සඳහා වෙන් කර ඇති ඉඩමේ ටී.පී.සී.එල් මගින් මෙගාවොට් 50 ක සූර්ය බලාගාරයක් සංවර්ධනය කිරීමට තීරණය කර ඇත. තවද, එන්.ටී.පී.සී සහ මණ්ඩලය විසින් කොටස් 50:50 කින් පිහිටුවන ලද නව සමාගමක් මගින් කෙරවලපිටියේ මෙගාවොට් 500 ක එල්එන්ජී බලාගාරය සංවර්ධනය කිරීමට තීරණය කර ඇත.<br><br>පසුගිය කාලසීමාව තුළ ටී.පී.සී.එල් හි පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී මෙම කරුණ අඛණ්ඩව සාකච්ඡා වූ අතර ටී.පී.සී.එල් මගින් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ටී.පී.සී.එල් සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර 2021 දී මණ්ඩලය සහ එන්.ටී.පී.සී අතර සූර්ය බලශක්ති සංවර්ධනය ආරම්භ කිරීම සඳහා බද්ධ ව්‍යාපාර ගිවිසුමක් අත්සන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. කෙසේ වෙතත්, බද්ධ ව්‍යාපාර ගිවිසුම අත්සන් කිරීමට පෙර නීතිපතිවරයාගෙන් අවශ්‍ය නීතිමය අවසරය ලබා ගත යුතුය.<br><br>මණ්ඩලය සහ එන්.ටී.පී.සී අතර පැවති සාකච්ඡා මාලාවකින් අනතුරුව කෙරවලපිටියේ එල්.එන්.ජී බලාගාරය සංවර්ධනය කිරීම සඳහා දෙපාර්ශවයම 2019 ඔක්තෝම්බර් 25 වන දින හවුල් ව්‍යාපාර ගිවිසුමකට අත්සන් තබා ඇත. තවද, 2021 ජූලි මාසයේදී සාංගමික ව්‍යවස්ථාවලිය සඳහා නීතිපතිවරයගේ නිෂ්කාශනය ලැබිණි.<br><br>COVID 19 බලපෑම හේතුවෙන් අද වන විට සාකච්ඡාවල ප්‍රගතිය නැවතී ඇත. කෙසේ වෙතත් යෝජිත ව්‍යාපෘති ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව ටී.පී.සී.එල් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ. | යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ) 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 42,358 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 5,122 ක ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,671 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.</td><td>වෙළඳ ණයගැති ශේෂය විශ්ලේෂණය කළ විට වෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 88 ක් වසරකට අඩු වයස්වල පසුවන අතර වසරකට වැඩි කාලයක් ඉක්ම වූ හිඟ ශේෂය සියයට 12 ක් පමණි. වසරකට වැඩි ශේෂයෙන් සියයට 52 ක් වසර පහකට වැඩි වන අතර එය මුළු ණය ගැතියන්ගෙන් සියයට 6 කි. වෙළඳ ණයගැතියන් ආපසු අයකර ගැනීම පසු විපරම් කිරීමට සියලුම බෙදාහැරීමේ අංශ අඛණ්ඩ උත්සාහයක් ගන්නා බව මෙයින් පෙන්නුම් කෙරේ.<br>කෙසේ වෙතත්, වසරකට වැඩි ණය ගැතියන්ගේ ශේෂය තවදුරටත් විශ්ලේෂණය කළ විට, ශේෂයෙන් සියයට 55 කට වඩා වැඩි ප්‍රමාණයක් අවසන් කරන ලද ණය ගැතියන්ගෙන් සමන්විත වන අතර දිගුකාලීන හිඟ ශේෂයන් එකතු කර ගැනීමට අඛණ්ඩ උත්සාහයක් ගනිමින් සිටී.</td><td>හිඟ ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනීම.</td></tr>
<tr><td>(ආ) 2020 දෙසැම්බර් 31 දිනට විවිධ ණය ගැතියන්ගෙන් එකතුව රු. 7,135,654,703 ක් වූ ණය ශේෂයන් වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.</td><td>විවිධ ණයගැති ශේෂය ප්‍රධාන වශයෙන් පහත ශේෂයන්ගෙන් සමන්විත වේ.
<table>
<tr><th>ශේෂයේ ස්වභාවය</th><th>මුදල (රු.)</th><th>හේතු සහ ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>ලැබිය යුතු ඊ.එස්.සී</td><td>3,914,723,821</td><td>රු.1,573,231,409 ක් වූ ලැබිය යුතු ඊ.එස්.සී, 2019 සහ 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශනවලට කපා හැරීමට නියමිතව තිබූ ඊ.එස්.සී කපා හැරීම නියෝජනය කරයි. කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2019 වර්ෂයේදී ඉදිරිපත්</td></tr>
</table></td><td>හිඟ ශේෂයන් අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.</td></tr>
</table>

කරන ලදි. කෙසේ වෙතත්, මෙම ආර්.එස්.සී ශේෂය කපා හැරීම වෙනුවට මෙම කරුණ විදුලිබල අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට යොමු කිරීම මගින් මෙම ශේෂය අයකර ගැනීමට හෝ වෙනත් ගෙවිය යුතු මුදලකට එරෙහිව පියවීමට විකල්ප සොයා බැලීම, මණ්ඩලයේ විගණන කමිටුවේ නිර්දේශය විය. වසර තුනකට සීමා වීම හේතුවෙන් මණ්ඩලය මත වූ ආර්.එස්.සී බර, 2018 ජාතික අයවැය යෝජනාවල කොටසක් ලෙස දැනටමත් මහා භාණ්ඩාගාරය වෙත දන්වා ඇති අතර බදු සහනවල කොටසක් ලෙස 2020 වර්ෂයේදී විදුලිබල අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත නැවත දැනුම් දෙන ලදි. කෙසේ වෙතත්, රු. 2,341.492,412.2

| | | |
|---|---|---|
| | | ක ඉතිරි ඊ.එස්.සී ශේෂයට අදාළ කාල සීමාව අවසන් වී නැත. |
| ලැබිය යුතු රදවා ගැනීමේ බදු | 149,252,278 | රු. 149,252,278 ක් වූ මුදල, 2016 වර්ෂයේ සිට ලැබිය යුතු රදවා ගැනීමේ බදු සහ සංකල්ප බදු නියෝජනය කරයි. මෙම ශේෂයන් අදාළ ආදායම් බදු ප්‍රකාශනවල රදවා ගැනීමේ බදු සහ සංකල්ප බදු ආපසු ගෙවීම් ලෙස ඇතුළත් වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු ලිපිගොනු තවමත් අවසන් කර නොමැති අතර රදවා ගැනීමේ බදු සහතිකපත් සහ විගණකවරුන්ගෙන් සංකල්ප බදු ප්‍රකාශය ඇතුළු අදාළ උපකාරක ලියකියවිලි මණ්ඩලය විසින් ඉල්ලා ඇත. |
| ඒ.ඊ.එස් කැළණිතිස්ස | 1,368,961,445 | දීර්ඝ කාලයක් තිස්සේ පවතින මතභේදයට තුඩු දී ඇති මෙම ශේෂය විසඳීම සඳහා විදුලිබල අමාත්‍යාංශය විසින් මණ්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, භාණ්ඩාගාරය සහ |

| | | | | |
|---|---|---|---|---|
| | | | විදුලිබල අමාත්‍යාංශයේ නියෝජිතයින් සමඟ රැස්වීමක් සංවිධානය කිරීමට නියමිතය. | |
| | සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | සිදු කරන ලද විමර්ශනයට අනුව නිකුත් කර ඇති කමිටු වාර්තාවට අනුව, මෙම ශේෂය ගිණුම් පොත්වලින් කපා හැරීමට නිර්දේශ කර ඇත. ඒ නිසා, ඒ සඳහා පියවර ගනු ඇත. | |
| | ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් | 497,144,445 | හේතු විමර්ශනය කර ශේෂය නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) ගල් අඟුරු හිඟය සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අයවිය යුතු රු. 714,965,435 ක මුදලක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ කිසිදු අයකර ගැනීමේ පියවරක් නොගෙන හිඟව පැවතුණි. | මෙම ශේෂය ටෝරියන් යකඩ හා වානේ සමාගමට අදාළව රු. 478,179,795 කින් සහ ලිබර්ටි කොමොඩිටිස් සමාගමට අදාළව රු. 236,785,639.43 කින් සමන්විත වේ. ටෝරියන් යකඩ හා වානේ සමාගමේ ශේෂය සම්බන්ධයෙන් කැබිනට් කමිටුවක් පත් කරන ලද අතර අවසන් වාර්තාව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත භාර දී තිබේ. ලිබර්ටි කොමොඩිටිස් සමාගම සම්බන්ධයෙන් ලංකා ගල් අඟුරු සමාගම බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ලංකා ගල් අඟුරු සමාගම විසින් ලිබර්ටි කොමොඩිටිස් සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව මෙම ශේෂය නිරවුල් වනු ඇත. | | | අයවිය යුතු ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (ඇ) වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපානය, වායුසමීකරණ යන්ත්‍රය සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනවලින් ලැබිය යුතු දැ යටතේ පෙන්වා ඇති රු. 115,093,276 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අය කර ගැනීමෙන් තොරව පවතී. | රාජ්‍ය ආයතනවලින් කල් ඉකුත් වූ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කළමනාකාරීත්වය විසින් ක්‍රියාමාර්ග මාලාවක් ගෙන ඇති අතර ඉහත අංක 1.2.3 (ඉ) විමසුමට අදාළ මගේ පිළිතුර විස්තරාත්මකව දක්වා ඇති අතර එම පිළිතුරම මෙම විමසුමටද අදාළ වේ.<br>කෙසේ වෙතත්, පසුගිය වසරවල වාර්තා වූ ගැටළු මඟහරවා ගැනීම සඳහා, 2018 දී, අතිරේක සමාන්‍යාධිකාරි (ඒ.එම්) විසින් විශේෂයෙන් රාජ්‍ය ආයතනවල පිරිවැය ආවරණය කර ගැනීමේ | | | හිඟ ශේෂයන් අයකර ගැනීමට සහ ගනුදෙනුව සිදු වූ අවස්ථාවේදී ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| | කාර්යයන් සම්බන්ධයෙන් හොඳ අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීමට මාර්ගෝපදේශ නිකුත් කර ඇති අතර ඒ අනුව, පිරිවැය ආවරණය කර ගැනීමේ කාර්යයන් භාර ගැනීම සහ ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් නිතිපතා අධීක්ෂණය කරනු ලැබේ. | |
| (ඉ) බෙදාහැරීමේ අංශය 01හි කාර්ය මණ්ඩල ණය මුදල රු. 3,835, 654 ක් අය නොවී පැවතුණි. | විමසුමේ මුළු ශේෂයෙන් රු. 622,684.25 ක් ඉල්ලා අස් වූ හෝ තනතුරෙන් ඉවත් වූ සේවකයින්ට අදාළ වේ. එබැවින්, ණය ශේෂය ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් ආපසු අයකර ගැනීමට සේවක අර්ථසාධක අරමුදල් ශාඛාව වෙත දන්වා ඇත. තවද, රු. 1,049,150 ක ණය ශේෂයක් පැවති විදේශ නිවාඩු ලබා 2021 වසරේ සිට නැවත සේවයට පැමිණ ඇති සේවකයකුට අදාළ වන අතර ණය ශේෂය ඔහුගේ වැටුපෙන් අයකර ගැනීම සඳහා වැටුප් ඒකකයට යවා ඇත. | හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඊ) බෙදාහැරීමේ අංශය 1 හි රු. 16,995, 630 ක මුදලක් පූජනීය ස්ථානවලින් වසර හතරකට වැඩි කාලයක් අය නොවී පවතී. | ඉහත ශේෂයට පොසොන් උත්සවය, දළදා පෙරහැර සහ පිච්ච මල් පූජා ආදී විවිධ ආගමික කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි උතුරු මැද පළාතේ සිදු කරන ලද තාවකාලික ආලෝකකරණ කාර්යයන් ඇතුළත් වේ. 2012-2015 කාලය තුළ ලැබිය යුතු මුළු මුදල රු. 19,995,630 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2014 ජූනි දක්වා රු. මිලියන 3 ක් ගෙවා ඇත. එතැන් සිට ඉතිරිය නොපියවා ඇති අතර සෑහීමකට පත්විය හැකි විසඳුමක් ලබා දී නොමැති නිසා එය විසඳන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉල්ලා ඇත. | හිඟ ශේෂයන් අයකර ගැනීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2020 දෙසැම්බර් 31 දිනට රු. 4,306,803,673 ක් වූ පහත සඳහන් ණය ශේෂයන් දිර්ඝ කාලයක් තිස්සේ නොපියවූ ලෙස පැවතුණි.<br><br>ණයහිමියාගේ නම - මුදල රු.<br>රේගුව - 1,065,828<br>චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු - 3,034,971, 432 | ණයහිමියාගේ නම: රේගුව<br>මුදල රු.: 1,065,828<br>පිළිතුර: 2017/18 වාරයේ රු. 1,065,828.00 ක ප්‍රමාද ගාස්තු ගෙවීම, 2020 දෙසැම්බර් 31 දක්වා ලක්විජය ප්‍රමාද ගාස්තු ගෙවීම් කමිටුව විසින් අනුමත කර නොමැත. ලක්විජය ප්‍රමාද ගාස්තු ගෙවීම් කමිටුවේ අනුමැතිය ලැබුණු පසු මෙම මුදල ගෙවනු ලැබේ. | වගකීම් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| සංස්ථාව | | | | | |
| ගෙවිය යුතු උද්දේශිත ලාභාංශ (deemed dividend) බද්ද | 1,270,766,413 | චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු සංස්ථාව | 3,034,971,432 | 2014, 2015, 2016 සහ 2017 සඳහා චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු සංස්ථාව වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව මෙහෙයුම් සහ නඩත්තු ගාස්තු වාරික වශයෙන් ගෙවා තිබුණි. 2017, 2018, 2019 සහ 2020 සඳහා ගෙවිය යුතු මෙහෙයුම් සහ නඩත්තු ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.4,195,528,596.54 ක් පෙන්නුම් කරයි. පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් මණ්ඩලය මසකට ඇ.ඩොලර් මිලියනයක් පමණක් ගෙවයි. | |
| | | ගෙවිය යුතු උද්දේශිත ලාභාංශ (deemed dividend) බද්ද | 1,270,766,413 | ගෙවිය යුතු රු. 1,270,766,413 ක උද්දේශිත ලාභාංශ බද්ද, 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂ සඳහා ඉල්ලුම් කරන ලද උද්දේශිත ලාභාංශ බදු ආපසු ගෙවීමට එරෙහිව පියවීමට නියමිත 2013/2014 තක්සේරු වර්ෂය සඳහා උද්දේශිත ලාභාංශ බද්දෙහි නොපියවූ වගකීම නියෝජනය කරයි. ගිණුම්වල මෙම වගකීම පියවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මුදල් ආපසු ගෙවීමේ ඉල්ලීම් තවමත් අවසන් කර නොමැත. | |
| (ආ) නොර්දන් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු රු. බිලයන 2.9 ක මුදලක් වසර දෙකකට වඩා වැඩි කාලයක් නිරවුල් කිරීමට | | මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගයක් හේතුවෙන් නොර්දන් පවර් බලාගාරය 2015-01-27 සිට වසා දමා ඇත. කෙසේ වෙතත්, සමාගම මෙය Force Majeure තත්වයක් ලෙස | | | එම මුදල කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | |
|---|---|
| කටයුතු කිරීමෙන් තොරව සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමියන් ලෙස පැවතුණි. | ප්‍රකාශ කරමින් ධාරිතාව ගාස්තු සඳහා මාසික ඉන්වොයිසි නිකුත් කර ඇත. අධිකරණ තීන්දුව ලබා දීමට නියමිතව තිබූ බැවින් මණ්ඩලය විසින් මෙම ඉන්වොයිසි වටිනාකම් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර ඇත. පරිසර නීතිය උල්ලංඝණය කරමින් බලාගාරය ක්‍රියාත්මක කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර ඇති බැවින් මෙම ඉන්වොයිසි පියවීමට මණ්ඩලයට වගකීමක් නැත. මෙම මුදල් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය. | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රයක් ලබා නොගත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 18.91 ක් වූ ගිගාවෝට් 732.192 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. | සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට විශ්‍රාමික අයි.පී.පී බලාගාරවලින් විදුලි බලය මිලදී ගැනීමට 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ (විදුලි පනත) 7(1) හෝ 43(1) වගන්තිවලින් කිසිදු නීතිමය බාධාවක් නොමැත. මෙම විශ්‍රාමික අයි.පී.පී බලාගාර තුනේ කල් ඉකුත් වූ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම සඳහා මණ්ඩලය මහජන උපයෝගීතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා තිබූ අතර අනුමැතිය සඳහා ඔවුන් වෙත දීර්ඝ කරන ලද බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් ඉදිරිපත් කර ඇත.<br>ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බවට සහතික වීමේ මණ්ඩලයේ වගකීමට (සම්ප්‍රේෂණ බලපත්‍රයක් දරන්නෙකු වශයෙන්) අනුකූල වීමට මණ්ඩලයට බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීමට සිදු විය. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව විදුලිය කප්පාදුව වළක්වා ගැනීමට මණ්ඩලය එසේ කර තිබුණි. | පනතේ එම විධිවිධානවල අවශ්‍යතාවලට අනුකූල වීම. |
| (ආ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1), 43 (2) සහ 43 (7) වගන්තිය. | විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම (පී.පී.ඒ) සඳහා අනුමැතිය ලබා නොගෙන, 2019 වර්ෂය තුළදී මාස හයක කාලයක් සඳහා උත්පාදන බලපත්‍රය ප්‍රදානය නොකරන ලද විදුලිබල නිෂ්පාදකයින්ගෙන් මෙගාවොට් 100 ක | 2019 වර්ෂය තුළදී මණ්ඩලයට මෙගාවොට් 100 ක අතිරේක විදුලි බලයක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලය සහ මහජන උපයෝගිතා කොමිෂන් සභාව යන දෙපාර්ශවයම මූලික අනුමැතිය ලබා දී ඇත. මණ්ඩලය ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ප්‍රසම්පාදනය දිගටම කරගෙන ගිය අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වූ පසු, රජයේ ටෙන්ඩර් පටිපාටිය යටතේ අවශ්‍ය සියළු නියමිත අනුමැතිය ලබාගෙන, 43 වගන්තිය යටතේ අවශ්‍ය වන | පනතේ එම විධිවිධානවල අවශ්‍යතාවලට අනුකූල වීම. |

| | | | |
|---|---|---|---|
| | අතිරේක විදුලිබල ධාරිතාවක් මිලදී ගෙන තිබුණි. එය 2020 පෙබරවාරි සිට මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 3.26 ක් වූ ගිගාවොට් 78.669 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. | අත්සන් කළ යුතු කෙටුම්පත් පී.පී.ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට මහජන උපයෝගීතා කොමිසමට ඉදිරිපත් කරන ලදි.<br>ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බවට සහතිකවීමේ මණ්ඩලයේ වගකීමට (සම්ප්‍රේෂණ බලපත්‍රයක් දරන්නෙකු වශයෙන්) අනුකූල වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව මණ්ඩලය ප්‍රසම්පාදනය ඉදිරියට ගෙන යන ලදි.<br>ඒ හා සමානව, 2020 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩලය සහ මහජන උපයෝගිතා කොමිෂන් සභාව යන දෙපාර්ශවයම ඉහත ප්‍රසම්පාදනය යටතේ අත්සන් කරන ලද පී.පී.ඒ අතිරේක මාස හයකට දීර්ඝ කිරීමට මූලික අනුමැතිය ලබා දෙන ලදි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසුව, පී.පී.ඒ කෙටුම්පත් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. | |
| (ඇ)1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 46 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 11 (අ) හා (ආ) වගන්තිය. | 2020 දෙසැම්බර් 31 දිනට රක්ෂණ එස්ක්‍රෝ අරමුදලේ මණ්ඩලය විසින් රු. මිලියන 8,996 ක් පමණක් ආයෝජනය කර තිබුණි. එහෙත් 1989 සිට සෑම වර්ෂයක් අවසානයේ දී දළ ස්ථාවර වත්කම්වල මුළු වටිනාකමෙන් සියයට 0.1 ක දායකත්වයක් එම අරමුදලට මාරු කළ යුතු බව සඳහන් වේ. | මණ්ඩලය වසර ගණනාවක සිට අහිතකර මුදල් ප්‍රවාහ තත්ත්වයන් අත්විඳින බැවින් රක්ෂණ ආයෝජන එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය නොකිරීම මෙම වෙනස ඇති වීමට ප්‍රධාන වශයෙන්ම හේතුවී ඇත. කෙසේවෙතත්, ලංවිම ද්‍රවශීලතා තත්ත්වය සහ මුදල් ප්‍රවාහය වැඩිදියුණු වූ පසු දළ ස්ථාවර වත්කම්වලින් සියයට 0.1 ට සමාන මුදලක් රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත්වල එම විධිවිධානවල අවශ්‍යතාවලට අනුකූල වීම. |
| (ඈ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පී.ඊ.ඩී 12 චක්‍රලේඛයේ 9.4 වගන්තිය. | විධිවිධානයට පටහැනිව, රේඛීය අමාත්‍යාංශය සහ මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සඳහා නිදහස් කරන ලද සේවකයන් 56 ක් සඳහා වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් රු. මිලියන 79.13 ක් ගෙවා තිබුණි. | රේඛීය අමාත්‍යාංශයට සේවකයන් නිදහස් කිරීම<br>තම සේවකයන් නිදහස් කරන ලෙසට රේඛීය අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීම් අත්හිටුවීමට මණ්ඩලයට හැකියාවක් නොමැති බැවින් ඒ සඳහා වන වියදම් මණ්ඩලයට පාලනය කළ නොහැක.<br>අර්ථසාධක අරමුදලට සේවකයින් නිදහස් කිරීම<br>2003 දෙසැම්බර් 31 දින ගැසට් පත්‍රයේ පළ කරන ලද අර්ථසාධක අරමුදල් රීති අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදලේ ආරම්භය සිට ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 1 දින සිට) එබැවින් | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයේ අවශ්‍යතාවලට අනුකූල වීම. |

| | | | |
|---|---|---|---|
| | | අර්ථසාධක අරමුදල වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත.<br><br>මෙම කරුණ මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021 පෙබරවාරි 11 වැනි දින පැවති රැස්වීමේ දී අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් මණ්ඩලය විසින් දැරීමේ වර්තමාන ක්‍රමවේදය දිගටම අනුගමනය කිරීමට කමිටුව තීරණය කළ අතර මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් දැරීමේ වත්මන් ක්‍රමවේදය දිගටම අනුගමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදි. | |
| (ඉ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 1994 ජූනි 14 දිනැති පී.ඊ.ඩී 95 චක්‍රලේඛය සහ අමාත්‍යාංශයේ විගණන කමිටුවේදී 2020 සැප්තැම්බර් 25 දින ගත් තීරණය. | විධිවිධානවලට හා තීරණවලට පටහැනිව, 2020 වර්ෂයේදී ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් ලෙස රු.බිලියන 1.2 ක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, මණ්ඩලය විසින් 1984 වසරේ සිට එහි සේවකයන් සඳහා භාවිත නොකරන ලද අසනීප නිවාඩු වෙනුවෙන් දිරි දීමනා ගෙවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනත් ආකාරයකින් වෙනස් කිරීමට තීරණය කරන තෙක් මෙම යෝජනා ක්‍රමය ඉදිරි වසර ගණනාව තුළ ක්‍රියාත්මක කිරීමට 2006 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදි. | එම විධිවිධානයට හා තීරණයට අනුකූල වීම. |
| (ඊ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය. | විධිවිධානයට පටහැනිව, ඉපැයීම් ගණනය කිරීමේදී නික්මයාමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දිමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල ලැයිස්තුගත කර ඇත.<br>*12 (m) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සැකසීම*<br>*12 (n) වගන්තිය: අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව එහි ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට*<br>ඒ අනුව, ආයතනයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම සඳහා ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් සඳහන් කරන ලද නිරීක්ෂණ සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම පනත මගින්ම සපයයි. ඒ අනුව සේවකයා වෙනුවෙන් EPF ගෙවීම ගණනය කිරීම සඳහා ඉහළම දීමනාව සලකා බලන ලදි. | පනතේ එම විධිවිධානයේ අවශ්‍යතාවලට අනුකූල වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) 2007 ජනවාරි 10 දින සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමඟ එළඹී විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය. | මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්මික පාරිභෝගිකයින්ට කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ විදුලිබල සැපයුමක් කරනු ලබන අවස්ථාවේදී එම විදුලිබල සැපයුමට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, සමාගම විසින් මණ්ඩලයට විදුලිබල සැපයුමක් කරනු ලබන අවස්ථාවේදී සමාගම විසින් අයකරනු ලබන විදුලිබල පිරිවැය යටතේ සමාගමෙන් අය කෙරේ. විධිවිධානයට පටහැනිව, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන ඇත. | සම්බන්ධිත වෝල්ටීයතාව 33kV ට වැඩි බොහෝ අයි.පී.පී තාප බලාගාරවලට සපයනු ලබන බලශක්තියට අදාළව පී.පී.ඒ හි සඳහන් ප්‍රතිපාදන සහ මණ්ඩලයේ ගාස්තු අයකිරීම අපැහැදිලි වේ. එබැවින් මෙම ගැටළුව විධිමත් කිරීම සඳහා පුළුල් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර විද්වත් කමිටුවක නිර්දේශ අවශ්‍ය වේ. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඌ) 2018 සැප්තැම්බර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | රජයේ ආයතන සතු පොරොත්තු ජනක යන්ත්‍ර උපයෝගී කර ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇත. | විවිධ හේතූන් මත ඉහත තීරණය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත. | අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීම. |
| (එ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය | දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම අනුව විදුලි බලාගාර ක්‍රියාත්මක නොවීම සහ තාප විදුලිය කෙටි කාලීන පදනමින් මිලදී | මණ්ඩලයේ දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් (LTGEPs) තුළ වසර 20 ක් සඳහා අවශ්‍ය කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන බලශක්ති ධාරිතාවන් සමන්විත වේ. මේ අනුව, ආසන්න වසර කිහිපයක කෙටි කාලීන ධාරිතා අවශ්‍යතාවය පවා මූලික | මෙම ප්‍රතිපාදනයට අනුකූල වීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි |

| | | | |
|---|---|---|---|
| | ගැනීම නිසා, විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය (සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා) අසමත් වී ඇත. | අවස්ථාව හෝ හදිසි විශ්ලේෂණය යටතේ LTGEPs හි දැක්වේ. දිගුකාලීන, අඩු වියදම් බලාගාර අපේක්ෂා කළ පරිදි නියමිත වේලාවට සංවර්ධනය නොකළ විට, (මණ්ඩලයේ පාලනයෙන් බැහැර බොහෝ හේතු නිසා) හිඟය වළක්වා ගැනීමට සහ විදුලිබල පනතේ 24(1)(ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බව සහතික කිරීමේ මණ්ඩලයේ (සම්ප්‍රේෂණ බලපත්‍රය දරන්නා ලෙස) වගකීමට අනුකූල වීම සඳහා කෙටි කාලීන අතිරේක ධාරිතාවක් ලබා ගැනීමට මණ්ඩලයට බලකෙරේ.<br>මේ අනුව, එම ප්‍රසම්පාදනය 24(1)(ඇ) වගන්තියට අනුකූල වීමට සිදු කර ඇති අතර එම නිසා එය උල්ලංඝනය කිරීමක් නොවේ. | ජනන පුළුල් කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම. |

### 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින සාමූහික ගිවිසුම සලකා බලන විට, උපයන විට ගෙවන (PAYE) බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) වගකීම සේවකයින් වෙත මාරු කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 2016/3 දරන චක්‍රලේඛයට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE බදු ගෙවා තිබුණි. 2020 වර්ෂය තුළදී බදු මත බදු ගාස්තු රු. මිලියන 5.48 ක් ඇතුළත්ව එසේ ගෙවා ඇති මුදල රු. මිලියන 57.04 ක් විය. | 2020 නොවැම්බර් මාසයේ සිට, අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (APIT) මණ්ඩලයේ සේවකයින් විසින් ගෙවනු ලැබේ. | කැබිනට් තීරණයට සහ චක්‍රලේඛයට අඛණ්ඩව අනුකූල වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 53,831 ක බදු පෙර අලාභයක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ බදු පෙර අලාභය රු. මිලියන 97,319 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 43,488 ක වැඩිවීමක් සමාලෝචිත වර්ෂයේදී පිළිබිඹු විය. ජල විදුලි උත්පාදනය සියයට 3 කින් වැඩිවීම හේතුවෙන් ඉන්ධන පිරිවැය, ගල් අඟුරු සහ බලශක්ති මිලදී ගැනීම් පිළිවෙලින් සියයට 43 කින්, සියයට 8 කින් සහ සියයට 9 කින් අඩු වීම සහ අංශවල මෙහෙයුම් හා නඩත්තු වියදම් සියයට 23 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, ඉල්ලුම නිස්සාරණය සහ ඉන්ධන සහ ගල් අඟුරු මිල පහත වැටීම ද මෙම වර්ධනයට බලපා ඇත.

කෙසේවෙතත්, සේවක පාරිශ්‍රමිකය, බදු වියදම සහ ක්ෂයවීම්වල එකතුව වන රු. මිලියන 73,895 ක් සැලකිල්ලට ගත් පසු සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ අගය එකතු කිරීම රු. මිලියන 101,054 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 12,699 කින් හෙවත් සියයට 11 කින් අඩු වී තිබුණි.

### 2.2 ප්‍රවණතා විශ්ලේෂණය

**(i) විදුලිබල උත්පාදනය සහ සෘජු පිරිවැය (බෙදා හැරීම සහ සම්ප්‍රේෂණය හැර)**

මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අඩු වියදමකින් රටට විදුලිය සැපයීම වුවද, විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල ඇති අහිතකර කොන්දේසි, තාප විදුලිය උත්පාදනය සඳහා අධික පිරිවැයක් දැරීම සහ සුළඟින් හා වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලැබෙන අඩු දායකත්වය හේතුවෙන් මණ්ඩලයට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.

තවද, මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන සැලැස්මට හා සම්ප්‍රේෂණ සැලැස්මට ඇතුළත් කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මණ්ඩලය විසින් හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කර තිබූ අතර එය මණ්ඩලයේ අවම පිරිවැය පරමාර්ථයට බලපා ඇත.

2020 දී විදුලිබල උත්පාදනය කිරීමේ තත්ත්වය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| **මූලාශ්‍රය** | **2020** | **2019** | **වැඩිවීම/ (අඩුවීම)** | |
|---|---|---|---|---|
| | **ගි.වො.පැය** | **ගි.වො.පැය** | **ගි.වො.පැය** | **%** |
| ජල විදුලිය | 4,958 | 4,795 | 163 | 3 |
| තාප | 4,179 | 5,012 | (833) | 17 |
| ගල් අඟුරු | 5,754 | 5,361 | 393 | 7 |
| සුළඟ | 332 | 348 | (16) | 5 |
| අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය | 218 | 220 | (2) | 1 |
| වහල මත සූර්ය | 269 | 182 | 87 | 48 |
| **කුඩා දූපත්** | **3** | **4** | **(1)** | **25** |
| **එකතුව** | **15,713** | **15,922** | **(210)** | **1** |

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ ජල විදුලිය, ගල් අඟුරු, සහ වහල මත සූර්ය පිළිවෙලින් සියයට 3 කින්, සියයට 7 කින්, සියයට 48 කින් වැඩි වී තිබුණු අතර රටේ කාලගුණ තත්ත්වය වාසිදායකවීම හේතුවෙන් තාප, සුළං සහ වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති උත්පාදනය පිළිවෙලින් සියයට 17 කින්, සියයට 5 කින් සහ සියයට 1 කින් අඩු වී ඇත.

(ii) **ඍජු පිරිවැය**

2020 වර්ෂයේ ඍජු පිරිවැය පිළිබඳ ප්‍රභව වශයෙන් විශ්ලේෂණය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2020 | | 2019 | |
|---|---|---|---|---|
| | රු . මිලියන | ප්‍රතිශතය | රු . මිලියන | ප්‍රතිශතය |
| ඉන්ධන | 30,195 | 11 | 53,238 | 17 |
| ගල් අඟුරු | 42,805 | 16 | 46,566 | 14 |
| බලය මිලදී ගැනීම | 108,401 | 40 | 118,665 | 37 |
| මෙහෙයුම් සහ නඩත්තුව | 56,481 | 21 | 73,121 | 23 |
| ක්ෂයවීම | 32,252 | 12 | 30,932 | 10 |
| **ඍජු පිරිවැය** | **270,134** | **100** | **322,522** | **100** |

ඉහත තොරතුරු වලට අනුව, ජල විදුලි උත්පාදනය සියයට 3 කින් වැඩි වී ඇති බව අනාවරණය වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2020 වර්ෂය සඳහා විදුලි බලය මිළදි ගැනීමේ පිරිවැය, ගල් අඟුරු සහ ඉන්ධන පිරිවැය පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් රු. මිලියන 10,264 කින්, රු. මිලියන 3,761 කින් සහ රු.මිලියන 23,043 කින් හෙවත් සියයට 9 කින්, සියයට 8 කින් සහ සියයට 43 කින් අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සියයට 23 කින් අඩු වී තිබුණි. තවද, විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල කොන්දේසි අනුව විදුලිබල උත්පාදනය සඳහා වන ස්ථාවර පිරිවැය වළක්වා ගත නොහැකි බව අනාවරණය වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, මහජනතාව වෙත අඩු වියදමකින් විදුලිය සැපයීමේ සිය වැදගත්ම අරමුණු සාක්ෂාත් කර ගැනීමට මණ්ඩලයට නොහැකි වී ඇත.

## 2.3 අනුපාත විශ්ලේෂණය

### 2.3.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2020 දෙසැම්බර් 31 දිනට සමූහයේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 59,370 ක ඍණ අගයක් ලෙස පිළිබිඹු වූ අතර පසුගිය වසර්ෂයේ ඍණ ශේෂය රු. මිලියන 93,834 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 37 කින් වැඩි වී තිබුණි.

### 2.3.2 ස්කන්ධයට ණය

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2020 දෙසැම්බර් 31 දිනට සමූහයේ ස්කන්ධ ශේෂය රු. මිලියන 19,936 කින් හෙවත් සියයට 6 කින් වැඩි වී තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් යොදවා ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට 84 ක් හෙවත් රු. මිලියන 475,440 ක් ණය ලබාගැනීම මඟින් මූලනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ස්කන්ධයට ණය අනුපාතය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 114 සිට සියයට 119 දක්වා වැඩි වී තිබුණි.

### 2.3.3 ලාභදායීතාවය

සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 21.21 ක් වූ අතර ඊට සාපේක්ෂව 2019 වර්ෂයේ එය රු. 24.12 ක් විය. ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.72 ක් විය. (පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.63 කි). ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක දළ අලාභය රු. 4.49 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ අලාභය වන රු. 7.49 ට සාපේක්ෂව එය සියයට 40 කින් අඩු වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ විකුණන ලද විදුලිය සඳහා වන ගාස්තු කාණ්ඩය සහ ඒකකයක ( කි.වො.පැය ) සහභාගය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත වගුවේ දැක්වේ.

| **කාණ්ඩය** | **ඒකකයක සහභාගය** | |
|---|---|---|
| | **( කි.වො.පැය )** | |
| | **2020** | **2019** |
| | රු. | රු. |
| ගෘහස්ථ | (6.35) | (9.16) |
| ආගමික | (13.99) | (15.98) |
| පොදු අරමුණු | 2.72 | 0.65 |
| හෝටල් | (3.11) | (5.58) |
| කාර්මික | (6.37) | (8.57) |
| රජය | (3.14) | (5.11) |
| LECO වෙත තොග සැපයුම | (5.18) | (10.67) |
| වීදි ආලෝකකරණය | (21.18) | (23.28) |
| සහභාගය ( සාමාන්‍ය දළ අලාභය ) | (4.49) | (7.49) |

ඒ අනුව, පොදු අරමුණු යටතේ ගාස්තු කාණ්ඩය පමණක් සමාලෝචිත වර්ෂයේ සමස්ත සහභාගයට ධනාත්මක දායකත්වයක් කර ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 318 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ත සහභාගය සඳහා ඉහළම ඍණාත්මක දායකත්වය ලබා දී ඇත්තේ කාර්මික හා ගෘහස්ථ කාණ්ඩයේ ගාස්තු වන අතර ආගමික, හෝටල්, රජය, LECO වෙත විකුණුම් සහ වීදි ආලෝකකරණය යන ගාස්තු ද අහිතකර දායකත්වයක් පෙන්නුම් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1 අනාර්ථික ගණුදෙනු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)2018-2037 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාව ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (පී.එම්.යූ) 2016 සැප්තැම්බර් මාසයේදී | මණ්ඩලයට තනියම මූල්‍ය සපයා ගැනීමට නොහැකි බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ණය මුදල් ශ්‍රී ලංකා රජය විසින් මණ්ඩලය වෙත සැපයීමේ අරමුණ ඇතිව සීතාව ගඟ ජල විදුලි ව්‍යාපෘතිය (SGHP) මණ්ඩලය සතු ජනන පහසුකමක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය 2016 වර්ෂයේදී පී.එම්.යූ පිහිටුවන ලදි.<br>ඒ අනුව, පී.එම්.යූ විසින් ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම්, මූල්‍යකරු සෙවීම සහ | අඩු ලංසු මිලකට/ සංවර්ධන පිරිවැයකට හේතු පාදක වීමට සිදු කරන ලද සියලුම අධ්‍යයනයන් යොදා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාපිත කළ අතර ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් කිරීම සහ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සකස් කිරීම වැනි කටයුතු සිදු කළේය. මෙම ව්‍යාපෘතිය මඟින් 2020 වර්ෂය අවසානයේදී රු. මිලියන 289 ක මුළු වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, ඉහත ව්‍යාපෘතිය සීස ශ්‍රී ලංකා බලශක්ති (පුද්) සමාගම හරහා සංවර්ධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර එසේම මෙම කොන්ත්‍රාත්තුව "තනි ප්‍රභව ප්‍රසම්පාදනයක්" ලෙස එම සමාගමට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2021 පෙබරවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. එම නිසා, මෙම අධ්‍යයන ආයෝජකයින් සමඟ බෙදා ගැනීමට නොහැකි නම් ව්‍යාපෘතිය සඳහා වැය කළ රු. මිලියන 289 ක් මණ්ඩලයේ වියදමක් ලෙස පවතින බව නිරීක්ෂණය විය. | කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සැකසීම යනාදී කටයුතුවල නිරත විය. මෙම කටයුතු සඳහා රු. මිලියන 289 ක මුදලක් වැය කර ඇති අතර පැහැදිලිවම ව්‍යාපෘතියක ශක්‍යතා අධ්‍යයනය (තාක්ෂණ හා මූල්‍ය) ඉතා ප්‍රධාන අංගයකි. කෙසේ වෙතත්, 2020-07-09 දින, විදුලිබල අමාත්‍යාංශය විසින් PE/DEV/02/171/ 2016 යන ලිපිය මඟින් පහත සඳහන් මූල්‍ය විකල්ප දෙක සලකා බැලීමට යෝජනා කරමින් මණ්ඩලයට දැනුම් දෙන ලදි.<br>• අරමුදල් රැස් කිරීම සඳහා ග්‍රීන් බොන්ඩ් නිකුත් කිරීම<br>• ගොඩ නැගීම-මෙහෙයවීම සහ මාරු කිරීම (BOOT) පදනම මත ටෙන්ඩර් සඳහා යාමට<br>එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංවර්ධන ආකෘතිය පිළිබඳව නැවත සොයා බැලීමට සහ සංවර්ධන ආකෘතිය මණ්ඩලය සතු බලාගාරයෙන් BOOT බලාගාරයක් දක්වා වෙනස් කර තරඟකාරී ටෙන්ඩර් කැඳවීමට මණ්ඩලයට සිදු විය.<br><br>ශක්‍යතා අධ්‍යයනය, ඊ.අයි.ඒ, සියලුම පරීක්ෂණ වාර්තා, සැලසුම් යනාදිය ඇතුළුව සිදු කරන ලද සියලුම අධ්‍යයනයන් අනාගත ලංසුකරුවන් (හෝ සංවර්ධකයින්) සමඟ බෙදා ගැනීම මණ්ඩලයේ යෝජනාව වූ අතර එවිට එවැනි අධ්‍යයනයන් ලංසුකරුවන්ට (සංවර්ධකයින්ට) ඔවුන්ගේ අවදානම් මට්ටම් අඩු කර ගැනීමට සහ එමඟින් අඩු ලංසු මිලකට/ සංවර්ධන පිරිවැයකට හේතුසාධක වීමට උපකාරී වේ. මේ අනුව, අධ්‍යයන කටයුතු සඳහා දරන ලද පිරිවැයෙන් කොටසක් ගාස්තු අඩු වීමක් මඟින් මණ්ඩලය වෙත ආපසු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි. (අවසාන ව්‍යාපෘති සංවර්ධකයා කවුරුන් වුවද). | |
| (ආ) | අයවැයෙන් රු. මිලියන 13 ක් වෙන්කර තිබියදී මන්නාරම සුළං බල උත්පාදන ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවය සඳහා රු. මිලියන 18.83 | මන්නාරම සුළං බලාගාරය විවෘත කිරීමේ උත්සවය මෙගාවොට් 100 ක ධාරිතාවයකින් යුත් දිවයිනේ විශාලතම සුළං උද්‍යානය වන මන්නාරම සුළං බල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට මණ්ඩලය උපායමාර්ගික තීරණයක් ගෙන ඇත. මෙය රජයේ ප්‍රතිපත්ති රාමුව සහ මණ්ඩලයේ ආයතනික ඉලක්ක | අයවැය ප්‍රතිපාදන තුළ වියදම් දැරීම හෝ මණ්ඩලයේ අනුමැතිය යටතේ අවශ්‍ය නම් අයවැය සංශෝධනය කිරීම. |

ක් වැය කර තිබුණි. වැඩිපුර වැය කර මුදල සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවය 2020 දෙසැම්බර් මාසයේදී පැවැත්වුණද, නඩුකුඩා විදුලිබල පද්ධතිය අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ජාතික පද්ධතියට සුළං බලය සම්බන්ධ කිරීම 2021 මැයි දක්වා ප්‍රමාද විය.

යටතේ ක්‍රියාත්මක වන දැවැන්ත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් බැවින් මෙම සංවර්ධන කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය ආවරණයක් සකස් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගෙන් ඉල්ලා තිබුණි.

2020 අග භාගයේදී, COVID 19 වසංගත තත්ත්වය සමඟ වුවද සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීමට මණ්ඩලයේ කළමනාකාරිත්වය තීරණය කරන ලදි. මණ්ඩලයේ කළමනාකාරිත්වය සමස්ත ව්‍යාපෘති කණ්ඩායමේ කැපවීම බෙහෙවින් අගය කළ අතර ව්‍යාපෘතියේ ධාරිතාවයෙන් කොටසක් ජාලගත කිරීමට තීරණය කරන ලදි. තවද, ප්‍රධාන ආරාධිතයා ලෙස ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් විවෘත කිරීමේ උත්සවය "රාජ්‍ය/ජාතික උත්සවයක්" ලෙස සංවිධානය කරන ලෙස විදුලිබල අමාත්‍යාංශය විසින් මණ්ඩලයට දැනුම් දෙන ලදි.

උත්සවය පැවැත්වෙන ස්ථානය, එනම් මන්නාරම, නඩුකුඩා ඉතා දුරස්ථ ස්ථානයක් වන බැවින් ඇස්තමේන්තු පදනම මත අයවැය සකස් කරන ලදි. සිද්ධි කළමනාකරණ සේවා සඳහා නිශ්චිත පිරිවැය සංරචක තක්සේරු කිරීමට අපහසු විය. සිද්ධි කළමනාකරණ සේවා සඳහා ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සත්‍ය පිරිවැය වැඩි බැවින්, දරන ලද සත්‍ය පිරිවැය සමඟ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - ව්‍යාපෘති අංශය වෙත ඉදිරිපත් කිරීමක් කරන ලදි. 2020 දෙසැම්බර් 23 දින සිද්ධි කළමනාකරණ සේවා සඳහා දරන ලද සත්‍ය වියදම වූ රු. 9,674,887.86 සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගන්නා ලදි.

ඉහත කරුණු වලට අමතරව මණ්ඩලයේ සංවර්ධන ක්‍රියාකාරකම්/වර්තමාන කටයුතු ආදිය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා DGM (B&OS) සහ AGM (ව්‍යාපෘති) හි 2020 අනුමත අයවැයෙන් රු. මිලියන 4.4 ක් භාවිතා කර ඇත.

එබැවින්, සුළං බලාගාරය විවෘත කිරීමේ උත්සවය සඳහා පිරිවැය අවශ්‍ය අයවැය අනුමතකිරීම්වලට යටත්ව දරන ලදි.

**නඩුකුඩා විදුලිබල පද්ධතිය නිම කිරීම ප්‍රමාදය**

නඩුකුඩා ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම ආසියානු සංවර්ධන බැංකුවේ ණයක් මගින් අරමුදල් සපයන සම්පූර්ණයෙන්ම වෙනම කොන්ත්‍රාත්තුවකි. ගිවිසුම් ක්‍රියාවලියට අනුව, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ දිනය 2021.04.15 වේ. ඒ අනුව, එය 2021.04.15

වන විට අවසන් කර ඇති අතර, එබැවින් එහි කිසිදු ගිවිසුම් ප්‍රමාදයක් නොමැත.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු. 1,044,791,162 කට අගය කරන ලද මෙට්‍රික් ටොන් 51,439.64 ක් 2020 ඔක්තෝබර් 16 දිනට ගල් අඟුරු තොගයේ හිඟය ලෙස හඳුනාගෙන ඇති නමුත් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. කෙසේ වෙතත්, රු. 1,044,791,162 කට අගය කරන ලද මෙට්‍රික් ටොන් 51,439.64 ක් 2020 දෙසැම්බර් 31 දිනට ගල් අඟුරු තොග හිඟය ලෙස ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණි.<br><br>එබැවින් 2020 දෙසැම්බර් 31 දිනට පවතින රු. 9,991,897,000 ක් වූ ගල් අඟුරු තොගයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.<br>තවද, රු. 3,207,727,326 ක මුදල ගල් අඟුරු තොග හිඟයක් ලෙස පැවති අතර 2019 දෙසැම්බර් 31 දක්වා ගල් අඟුරු අතිරික්තයක් ලෙස පැවති රු. 1,301,433,359 ක් 2020 ඔක්තෝබර් 06 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණි. | මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාගේ 2020 සැප්තැම්බර් 3 දිනැති අංක 2020/GM/42/FM චක්‍රලේඛය අනුව භෞතික සත්‍යාපනයක් සිදු කර ඇත.<br>උපුටා ගැනීම;<br>"ලක්විජය බලාගාරයේ ගල් අඟුරු තොග සහ ජනන සහ සම්ප්‍රේෂණ අංශවල අමතර කොටස් සත්‍යාපනය අදාළ අංශ සහ ශාඛා ප්‍රධානීන් විසින් තීරණය කරනු ලබන පරිදි වඩාත් සුදුසු සහ පහසු කාලයකදී සිදු කළ යුතුය."<br>උපුටා ගැනීමේ අවසානය<br>අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ අවශ්‍ය කමිටු වාර්තා අනුව ඉහත සඳහන් තොග ගැලපීම ගිණුම් පොත්වලින් ඉවත් කර ඇත. 2021 වර්ෂය තුළදී යම් ඉතිරියක් නිරවුල් කරනු ලැබේ. | ලද තොගය මැනීම සඳහා ක්‍රියාපටිපාටියක් ස්ථාපිත කිරීම සහ වසර අවසානයේ භෞතික සත්‍යාපනයක් සිදු කිරීම. |
| (ආ) මණ්ඩලය විසින් ලංකා විදුලි (පුද්.) සමාගම (ලෙකෝ) වෙත විදුලිය විකිණීම සහ වසර ගණනාවක් තිස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදු කර ඇතත්, මෙම ආයතන දෙක සමඟ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ එළඹි විකුණුම් හා | <u>ලෙකෝ සමඟ ගිවිසුම</u><br>මෙම කාරණය සම්බන්ධ ප්‍රගතිය පහත පරිදි වේ.<br>• මණ්ඩලයේ සහ ලෙකෝ යන දෙපාර්ශවයේම උසස් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් විසින් කෙටුම්පත් ගිවිසුමක් සකස් කර ඇති අතර ඒ පිළිබඳව නීතිපතිවරයාගේ මතය විමසා ඇත.<br>• කමිටුව නීතිපතිවරයාගේ මතය අනුව | ඔවුන් සමඟ සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ ගිවිසුමකට එළඹීම. |

මිලදී ගැනීමේ ගිවිසුම් නොතිබුණි.

අවශ්‍ය සංශෝධන සිදු කර ඇති අතර ඒ.ජී.එම් (සම්ප්‍රේෂණය) වෙත "අවසන් බලශක්ති විකුණුම් ගිවිසුම" ඉදිරිපත් කර ඇත.

- කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට ලෙකෝ හි නිලධාරීන් 03 දෙනෙකු විසින් කරන ලද සමහර අනුමත කිරීම් සම්බන්ධයෙන් ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් ලෙකෝ හි සාමාන්‍යාධිකාරී වෙත ලිඛිතව විමසා ඇත. එම ලිපියේම ලංවිම ජී.එම් විසින් ලෙකෝ හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මෙම කාරණය සලකා බලන ලෙස යෝජනා කර ඇත.

කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට ලෙකෝ හි නිලධාරීන් 03 දෙනෙකු විසින් කරන ලද අනුමත කිරීම් සම්බන්ධයෙන්, කරුණාකර පහත දක්වා ඇති විස්තර කෙරෙහි අවධානය යොමුකරන්න.

ජනවාරි 28 දිනැති ලිපිය සහ 2020 ජනවාරි 30 දිනැති මණ්ඩලයේ සමාන්‍යාධිකාරිගේ සටහන කෙරෙහි කරුණාකර අවධානය යොමුකරන්න. ඒ අනුව, මණ්ඩලයේ සමාන්‍යාධිකාරී එහි ඇති නිර්දේශවලට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී ඇත. තවද, මණ්ඩලයේ බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටුව (DCC) විසින් අධ්‍යක්ෂ පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර ලෙකෝ බලය බෙදා හැරීම සඳහා වෙන්කළ 33kV උපපොළවල් සහ 33kV/11kV ප්‍රාථමික උපපොළවල් භාර දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මේ වනවිට ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී.

මෙම කර්තව්‍යයේ අවසානයත් සමඟ, එවකට ලෙකෝ මෙහෙයුම් ප්‍රධානී, ගුණසේකරම් මහතා, එවකට ලෙකෝ ප්‍රධාන ඉංජිනේරු, PSN ද සිල්වා මහතා සහ එවකට ලෙකෝ ප්‍රධාන මූල්‍ය නිළධාරී, WDAS පෙරේරා මහතා විසින් 2015 මාර්තු වාර්තාවට යෙදූ සටහන පරිදි "බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) සතු ලෙකෝ සැපයුම් ස්ථාන පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කිරීම" පිළිබඳ දීර්ඝ කාලයක් බලා සිටි ගැටළු විසඳනු ලබන අතර විකුණුම් ගිවිසුම අත්සන් කිරීමට මග සලසනු ඇත.

| | | |
|---|---|---|
| | ලෙකෝ විසින් මෙම කරුණ සම්බන්ධයෙන් PUSCL වෙතින් යම් ක්‍රියාමාර්ගයක් ඉල්ලා ඇත.<br><br><u>සී.පී.සී සමග ගිවිසුම</u><br>සී.පී.සී සමහ ඇති ඉන්ධන සැපයුම් ගිවිසුමේ කෙටුම්පත තවමත් සාකච්ඡා මට්ටමේ පවතී. දෙපාර්ශ්වය විසින් එකඟ විය යුතු ඇතැම් කරුණු ඇත. සී.පී.සී විසින් ලංවිමෙන් රු. බිලියන 30 ක ඇපකරයක් ඉල්ලා සිටින අතර එහිදී භාණ්ඩාගාරය විසින් එකඟතාව නිකුත් කරනු ලැබේ. එබැවින් තවමත් ගිවිසුම අවසන් කර නොමැත. | |
| (ඇ) අරමුදල් කාලිනව උපයෝජනය නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති ණයවලින් බැඳීම් ගාස්තු ලෙස 2020 දී රු. 92,693,772 ක මුදලක් ණය දෙන ආයතනය විසින් අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ගණනය කිරීම් ලබා ගැනීමට නොමැති බැවින් බැඳීම් ගාස්තු වල නිරවද්‍යතාවය සත්‍යාපනය කළ නොහැක. | බැඳීම් ගාස්තුව සියලුම ව්‍යාපෘති සඳහා පොදු වන අතර ණය ගිවිසුම්වල දැඩි ණය කොන්දේසි හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත වේලාවට සිදු වුවද එය වැළැක්විය නොහැක.<br>කෙසේ වෙතත්, ඉහත ශේෂයෙන් ව්‍යාපෘති 3 කට අදාළ රු. 38,881,225.27 ක් මණ්ඩලය විසින් නොදරයි. තවද, 2020 වසර සඳහා පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය සඳහා බැඳීම් ගාස්තුවක් නොමැත. | අතිරේක බැඳීම් ගාස්තු වළක්වා ගැනීම සඳහා සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම. |
| (ඇ) 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019 සහ 2020 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක සහ මෙගාවොට් 430 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 1,587 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 381.85 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර | මණ්ඩලය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් (LTGEPs) සකස් කළද, LTGEPs හි හඳුනාගෙන ඇති එවැනි බලාගාර සංවර්ධනය කිරීමට මණ්ඩලයට තනි බලයක් නැත. මණ්ඩලය අනෙකුත් ආයතන මත දැඩි ලෙස රඳා පවතින අතර සහ PUCSL මගින් ප්‍රකාශයට පත් කරන ලද "2016 අංක 02 දරන විදුලි (ප්‍රසම්පාදන) රීති" සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැනි අනෙකුත් ආයතනවල රීති සහ මාර්ගෝපදේශ මගින් පාලනය වේ. මෙම ක්‍රියාවලීන්ගෙන් සමහරක් අති ව්‍යාප්ති වේ.<br>උදාහරණයක් ලෙස, කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2016 අංක 02 දරන විදුලි (ප්‍රසම්පාදන) රීතිවල 2(xi) වගන්තියට අනුව, ජනන ධාරිතාව ප්‍රසම්පාදනය කිරීමට පෙර විදුලිබල පනතේ 43(2) වගන්තිය යටතේ අවශ්‍ය වන මූලික අනුමැතිය ලබා ගැනීමට මණ්ඩලය විසින් කෙටුම්පත් යෝජනා ඉල්ලීම් (RFP) (වෙනත් බොහෝ | අවම පිරිවැය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම. |

සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු වී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 22.2 ක් වටිනා ගිගාවොට් පැය 811 ක හදිසි අවස්ථා විදුලි බලයක් ලෙස මිලදී ගෙන තිබුණි.

ලියකියවිලි අතර) කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එම RFP ලේඛනය අනුමැතිය සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවකට (බොහෝ විට ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව - SCAPC) ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. PUCSL අනුමත RFP, SCAPC විසින් වෙනස් කළ විට හෝ SCAPC අනුමත RFP, PUCSL විසින් වෙනස් කළ විට, නැවතත්, ලේඛනය සමාලෝචන ක්‍රියාවලියක් හරහා ගොස් අනුමැතිය සඳහා එක් ආයතනයකට ඉදිරිපත් කළ යුතුය.

ප්‍රතිපත්ති සහ ගුණාංග වෙනස් කිරීම
තවද, නිරන්තරයෙන් ප්‍රතිපත්ති වෙනස් කිරීම, සිදු කරමින් පවතින විදුලිබල ප්‍රසම්පාදනයේ ප්‍රධාන ගුණාංග අතරමගදී වෙනස් කිරීමට නියෝග කිරීම (තාක්ෂණය, පිහිටීම, BOO සිට BOT දක්වා හිමිකාරිත්වයේ ආකෘතිය, ධාරිතාව වෙනස් කිරීම වැනි) සහ ඉතා පරිණත අවධියක ඇති බලශක්ති ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් අවලංගු කිරීම, ප්‍රසම්පාදනය මාස සහ අවුරුදුවලින් සැලකිය යුතු ලෙස පසුපසට යාමට හේතු විය හැක.

මූල්‍ය හිඟය
මුදල් සුරක්ෂිත කිරීමට ප්‍රමාදයන් ද ඇත. (වාර්තාවේ වෙනත් තැනක සඳහන් කර ඇති සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතියට අදාළ නිරීක්ෂණයට පෙන්වා ඇති පරිදි)
1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 38 වැනි වගන්තිය යටතේ, මණ්ඩලයේ ආදායම මණ්ඩලයේ සේවා සංවර්ධන පිරිවැයෙන් සාධාරණ ප්‍රතිශතයක් සපුරාලීමට ප්‍රමාණවත් බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ලබා දෙන ලදි. කෙසේ වෙතත්, එවැනි මුදල් සුරක්ෂිත කිරීම සඳහා මණ්ඩලය සතුව තිබූ "මෙවලම" (විදුලිබල මණ්ඩල පනතේ V කොටස යටතේ) එනම් ගාස්තු සහ අයකිරීම් නියම කිරීමේ බලතල, 2009 දී මණ්ඩලයෙන් ඉවත් කර ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් PUCSL වෙත ලබා දෙන ලදි. එතැන් සිට පිරිවැය පරාවර්තක ගාස්තුවක් ලබා නොදීම හේතුවෙන් මණ්ඩලයට තමන්ගේම මුදලින් කිසිදු සංවර්ධන කටයුත්තක් කිරීමට

| | | |
|---|---|---|
| | නොහැකි විය.<br>තවද, අනෙකුත් රාජ්‍ය චක්‍රලේඛ සහ පනත් හේතුවෙන්, ණය දෙන ආයතනවලින් කරනු ලබන සියලුම අරමුදල් ඉල්ලීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා යොමු කළ යුතුය. රජයේ මූල්‍ය අවකාශයේ ඇති බාධාවන් හේතුවෙන් සහ මූල්‍ය හිඟය හේතුවෙන් සම්ප්‍රේෂණ සහ ජනන ව්‍යාපෘති ප්‍රමාද විය හැකිය. | |
| (ඉ) අවුරුදු තුනක ප්‍රමාදයක් සහිතව 2017 අප්‍රේල් මාසයේදී අවසන් වූ උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 දී හඳුනාගත් රු. 39,551,696 ක තොග හිඟය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ශාඛාව විසින් විශේෂ පරීක්ෂණයක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විටත් රු. 2,510,056 ක තොග හිඟයට වගකිව යුතු නිලධාරියාට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. තවද, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් 2015 දී ත්‍රිකුණාමලයේ මහේස්ත්‍රාත් උසාවියේ නඩුවක් (නඩු අංක B / 1164/15) ගොනු කර තිබියදී රු. 39,551,696 ට එරෙහිව රු. 31,257,161 ක් 2020 දී ලේජර ගිණුම්වලට ගලපා තිබුණි. කෙසේ වෙතත්, මෙම තොග ප්‍රමාදයට සහ ප්‍රමාද වූ ව්‍යාපෘතියේ ආවස්ථික පිරිවැයට වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | <u>තොග හිඟය රු. 2,510,056</u><br>නි.සා (උතුරු පළාත) විසින් ඔහුගේ 2017-05-04 දිනැති අංක එන්.පී/ඩී.ජී.එම්/එච්.ආර්.ඕ/විමසීම් යන ලිපිය මඟින් කමිටුවක් පත් කර ඇති අතර කමිටු වාර්තාව 2019-10-03 දින නි.සා (උතුරු පළාත) වෙත භාර දී ඇත. ඒ අනුව, නි.සා (උතුරු පළාත) විසින් ඔහුගේ 2019-10-09 දිනැති අංක එන්.පී/ඩී.ජී.එම්/එච්.ආර්.ඕ/විමසීම් යන ලිපිය මඟින් තොග හිඟය වන රු. 2,510,056.88 ක් (මණ්ඩල ගාස්තු ඇතුළුව) ගබඩා භාරකරු ජේ. ඒ.එම්. අසංක ජයකොඩි (පී.ඊ අංක 37432) යන අයගෙන් අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත. මෙම ගබඩා භාරකරු 2019 ඔක්තෝම්බර් මාසයේදී නි.සා (උතුරු මැද පළාත) වෙත මාරු කර යවා ඇති අතර ඔහුගෙන් අය කර ගත යුතු ඉතිරි මුදල (රු. මිලියන 2.5) වෙනත් ලැබිය යුතු දෑ යටතේ සටහන් කර ඇත. අ.සා (ඩී.ඩී1) විසින් ඔහුගේ 2019-11-28 දිනැති අංක ඩී.ජී.එම්(සී.සී)/ඩී.ඩී1/එච්.ආර්.ඕ /ඒ.ඩී.එම්.එන්/10 යන ලිපිය මඟින් සේවකයාගෙන් මෙම මුදල අයකර ගැනීමට උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, ජයකොඩි මහතා සිය 2020-01-06 දිනැති ලිපියෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටි අතර ඒ අනුව චෝදනා පත්‍රය නිකුත් කර ඇත.<br>තවද, අ.සා (ඩී.ඩී1) විසින් ඔහුගේ 2020-09-03 දිනැති අංක ඒ.ජී.එම් (ඩී.ඩී1)/ඩී.ජී.එම්(සී ඇන්ඩ් සී/එච්.ආර්.ඕ / ඩී.ඩී1/162 යන ලිපිය මඟින් විධිමත් පරීක්ෂණ තීන්දුවට යටත්ව වාරික 180 කින් හිඟය අයකර ගැනීමට උපදෙස් දී ඇත.<br><u>තොග හිඟය රු. 31,257,161</u><br>මේ සම්බන්ධයෙන් ද්‍රව්‍ය ලබා නොදී වංචනික ලෙස රු. 22,584,800.00 ක මුදලක් ලබා ගැනීම හේතුවෙන් | තොග හිඟයට වගකිව යුතු නිලධාරියාට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සහ තොග ප්‍රමාදයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව ගෙන ඇති විනය ක්‍රියාමාර්ග සැලකිය යුතු කාලයක් ඇතුළත අවසන් කිරීම. |

| | | |
|---|---|---|
| | මණ්ඩලයෙහි නීති නිලධාරියා විසින් රිවඩ්සන් ප්‍රොජෙක්ට්ස් (පුද්.) සමාගමට සියයට 25 ක් වූ මාණ්ඩලීය ගාස්තුවක් සහිතව රු.28,331,000.00 ක මුදලක් ගෙවන ලෙස එන්තරවාසියක් නිකුත් කර ඇත. මීට අමතරව, අලාභයට එරෙහිව තවදුරටත් ගැලපීම් හඳුනා ගැනීම සඳහා තොග ද්‍රව්‍ය තවදුරටත් සත්‍යාපනය කිරීම කඩිනමින් සිදු කරන ලදි. ඒ අනුව යම් ගැලපීම් සිදු කිරීමෙන් පසු අලාභය රු. මිලියන 8.30 කට අඩු වී ඇත. මේ වන විට අභ්‍යන්තර පරීක්ෂණය අවසන් කර ඇති අතර ඒ අනුව ගබඩා භාරකරු යූ.පී.උදාර ගුණරත්න මහතාට (පී. එෆ් අංක 37475) එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ඇත. තවද, අංක බී/1164/15 දරන අධිකරණ නඩුව ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී. විනය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. | |
| (ඊ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. 3,674,861 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන දින දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම මණ්ඩලයේ වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, පෙර වංචාව සැලකිල්ලට ගැනීමෙන් තොරව වංචාවේ වටිනාකම ලෙස රු. 99, 155 ක් පමණක් අය කර ගැනීමෙන් පසුව ඔහුගේ රාජකාරිය අවසන් කර ඇත. | මණ්ඩලය නඩු පැවරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය විමසා ඇති අතර රටේ පවතින කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් රැස්වීම කල් දමා ඇත. | පාඩුව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ යම් වංචාවක් සිදුවී ඇත්නම්, සැලකිය යුතු කාලසීමාවක් තුළ විමර්ශනයක් පවත්වා විදුලිබල මණ්ඩලයට සිදුවන පාඩුව වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගැනීම. |
| (උ) පරීක්ෂණය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කළ පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව රු. 3,789,893 ක තොග හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව ඉහත සඳහන් ප්‍රමාණාත්මක මුදල ගිණුම් පොත්වල | විගණන වාර්තාවට අනුව තොග හිඟය රු. 3,789,893.00 කි. කෙසේ වෙතත්, 2010 වර්ෂයේ දී තොග විචලනය විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව එම තොග හිඟ මුදල රු. 1,953,484.15 ක් ලෙස දක්වා ඇත. අදාල නිලධාරියා වන සමරසිංහ මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු 2011-10-15 දින විශ්‍රාම ගොස් ඇත. තොග හිඟය පිළිබඳ තීරණයක් ගන්නා තුරු විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත දීමනාව නතර කිරීමට ඔහු විශ්‍රාම යන අවස්ථාවේදී ක්‍රියා | පාඩුව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ යම් වංචාවක් සිදුවී ඇත්නම්, සැලකිය යුතු කාලසීමාවක් තුළ විමර්ශනයක් පවත්වා මණ්ඩලයට සිදුවන පාඩුව වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගැනීම. |

<table>
<tr><td>පැවතුණි. පැහැර හරින්නාට විශ්‍රාම ගැනීමට අවසර දුන් නිලධාරීන්ට එ රෙහිව පියවර නොගෙන මෙම මුදල කපා හැරීමට මණ්ඩලය කටයුතු කරමින් සිටියි.</td><td>කරන ලදි.<br>තොග හිඟය අයකර නොගැනීම පිළිබඳව සොයා බැලීම සඳහා නි.සා 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. කමිටු වාර්තාව මෑතකදී ඉදිරිපත් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.</td><td></td></tr>
<tr><td>(ඌ) පද්ධතිය තොග සහ සාමාන්‍ය ගනුදෙනුකරුවන් සඳහා ක්‍රියාකාරී සහ අවසන් කළ ණයගැති ශේෂයන් වෙන වෙනම හඳුනා ගැනීම සඳහා වෙන වෙනම පාලන ගිණුම් හතරක් වෙන් කර තිබියදී සමහර පළාත්වල සියලුම ණය ගැතියන්ගේ ගනුදෙනු සඳහා එක් පාලන ගිණුමක් භාවිතා කර තිබුණි.</td><td>බොහෝ පළාත් ඒ 3600 යටතේ උප ගිණුම් කේත භාවිතා කර ඇති අතර එමඟින් ශේෂයන් වෙන වෙනම හඳුනා ගැනීමට හැකි වේ.</td><td>ක්‍රියාකාරී සහ අවසන් කළ ණයගැති ශේෂයන් වෙන වෙනම හඳුනා ගැනීමට වෙන් වෙන් වශයෙන් පාලන ගිණුම් භාවිතා කිරීම.</td></tr>
<tr><td>(එ) රු. 62,951,457,952 ක් වූ වේලිවල (dams) අයිතිය පවරා ගැනීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.</td><td>වාර්තාවේ පෙන්වා ඇති අගය පහත පරිදි වේ,<table>
<tr><th>බලාගාරය</th><th>වත්කම් වටිනාකම</th></tr>
<tr><td>වික්ටෝරියා බලාගාරය</td><td>14,412,751,075.25</td></tr>
<tr><td>කොත්මලේ විදුලි බලාගාරය</td><td>22,087,081,294.30</td></tr>
<tr><td>උකුවෙල විදුලි බලාගාරය</td><td>2,581,412,890.05</td></tr>
<tr><td>බෝවතැන්න විදුලි බලාගාරය</td><td>1,968,826,674.74</td></tr>
<tr><td>රන්දෙණිගල සහ රන්ටැඹේ විදුලි බලාගාර</td><td>21,901,386,018.15</td></tr>
<tr><td>එකතුව</td><td>62,951,457,952.49</td></tr>
</table>ඉහත සඳහන් බලාගාරවලට අදාළ අනෙකුත් සියලුම වේලි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම එහි පනත මගින් සිදු කෙරේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ජලාශවලදී විදුලිය ලබා ගැනීම දක්වා වූ ජල මාර්ග පමණක් අත්පත් කරගෙන ඇති අතර ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අදාළ බලාගාර මගින් සිදු කෙරේ.</td><td>වේලිවල අයිතිය ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.</td></tr>
<tr><td>(ඒ) 1969 අංක 17 ලංකා විදුලිබල මණ්ඩල පනතේ 47(2)(අ) වගන්තිය යටතේ ස්ථාපිත ක්ෂයවීම් සංචිතයට රු. මිලියන 1</td><td>2020 දී රු. මිලියන 1 ක් ක්ෂයවීම් සංචිතයට මාරු කරන ලද අතර එය 1969 අංක 17 ලංකා විදුලිබල මණ්ඩල පනතේ 47(2)(අ) වගන්තියට අනුකූලව සෑම වසරකම</td><td>ක්ෂයවීම් සංචිතයට මුදල් මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.</td></tr>
</table>

| | | |
|---|---|---|
| ක මුදල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිසි පදනමක් නොමැතිව මාරු කර ඇත. | අඛණ්ඩව සිදු කරනු ඇත. 2020.12.31 දිනට ක්ෂයවීම් සංචිතයේ ශේෂය රු. මිලියන 25 කි. 2021 වසරේ සිට, අවශ්‍ය නම් ලබන වසරේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. | |
| (ඔ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 47(1)(අ) වගන්තිය යටතේ ස්ථාපිත කර ඇති ස්වයං රක්‍ෂණ සංචිතයට රු. 1,222,713,673 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සහ නිසි පදනමකින් තොරව මාරු කර තිබුණි. | 2020 දී, දළ ස්ථාවර වත්කම් වලින් සියයට 0.1 ස්වයං රක්ෂණ සංචිතයට මාරු කරන ලද අතර එය 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 47(1)(අ) වගන්තියට අනුකූලව සෑම වසරකම අඛණ්ඩව සිදු කරනු ඇත. 2021 වසරේ සිට, අවශ්‍ය නම් ලබන වසරේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. | රක්ෂණ සංචිතයට මුදල් මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම. |
| (ක) දිවයින පුරා විසිරී ඇති මණ්ඩලයේ ඉඩම් මැනීම, තක්සේරු කිරීම සහ ආරක්ෂා කිරීම කඩිනම් කිරීමට කටයුතු නොකිරීම. | මණ්ඩලයේ ඉඩම් මැනීම සහ තක්සේරු කිරීම කඩිනම් කිරීමට කටයුතු කරමින් පවතී. 2021-08-26 වන විට මණ්ඩලයේ ඉඩම් මැනීමේ සහ තක්සේරු කිරීමේ ප්‍රගතිය අනුව අමතර ඉඩම් 1,300 ක් හඳුනාගෙන ඇති අතර තක්සේරු කිරීම් සිදුකරමින් පවතී. | මණ්ඩලයේ ඉඩම් මැනීමේ සහ තක්සේරු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට රු. 26,751,970,000 ක් වූ පරිභෝජනයට ගත හැකි මුළු තොගයෙන් සියයට 10 ක් නියෝජනය වන රු. 2,667,400,265 ක තොග සෙමින් චලනය වන, චලනය නොවන සහ පළුදු වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. මේ තරම් චලනය නොවන සහ සෙමින් චලනය වන තොග පවත්වාගෙන යාමෙන් හානි, රඳවා තබා ගැනීමේ පිරිවැය සහ වංචාවන් ආදිය වැඩි වීමට හේතු විය හැකිය. | කමිටු පත් කිරීම, සමීක්ෂණ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හරහා සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය තොග අපහරණය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, බෙදා හැරීමේ අංශය 2 හි රු. 38,947,687.46 ක් වටිනා සෙමින් චලනය වන තොග අපහරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දැනටමත් ලබා ගෙන ඇත. | හානි, රඳවා තබා ගැනීමේ පිරිවැය සහ වංචා ආදිය වළක්වා ගැනීම සඳහා චලනය නොවන සහ සෙමින් චලනය වන තොග අඩු කිරීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී ජනන අංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 76 අතුරින් ක්‍රියාකාරකම් 16 ක් පමණක් සාක්ෂාත් කරගෙන තිබුණි. | ක්‍රියාකාරකම් සැලැස්මේ දැක්වෙන මූල්‍ය ප්‍රගතිය 16 ක් පමණක් වුවද, සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී. | සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම කඩිනම් කිරීම. |

(ඇ) සී/ස ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ එළඹී විදුලිබලය මිළදි ගැනිමේ ගිවිසුම අනුව අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) වසරකට කිලොවොට් පැය 697,674,432 ක් වුවද, 2020 වර්ෂය තුළදී ඒකකයකට රු. 24.42 ක පිරිවැයක් යටතේ කිලොවොට් පැය 475,831,835 ක බලශක්තියක් සපයා ගන්නා ලදි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සපයා නොගත් කිලොවොට් පැය 221,842,597 ක බලශක්තිය සඳහා ධාරිතා ගාස්තු ගෙවා ඇත. කෙටිකාලිනව දකුණු පළාතට බලශක්ති සැපයීම සඳහා මාතරට මෙගාවොට් 20 ක, හම්බන්තොටට මෙගාවොට් 24 ක සහ ගාල්ලට මෙගාවොට් 24 ක ධාරිතාවක් සපයා ගැනීම සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව, මෙම බලාගාරවලින් එකතුව රු. 4,069,542,205 ක පිරිවැයකට එකතුව කිලෝවොට් පැය 130,526,364 ක බලශක්තියක් සමාලෝචිත වර්ෂය තුළදී සපයා ගෙන තිබුණි. ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.72 ක් වන විට මෙම බලාගාරවල ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 28.30 ක්, රු. 36.84 ක් සහ රු. 39.52 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි.

බලාගාර භාවිතයට ගැනීම එහි බලශක්ති පිරිවැය මත පදනම්ව තථ්‍ය කාලීන ඉල්ලුමේ අවශ්‍යතාවයට අනුව බව සැලකිල්ලට ගත යුතු අතර එම නිසා MGEA සලකා බලනු ලබන්නේ බලාගාරය ලබා ගැනීමේ හැකියාව මත ධාරිතා ගාස්තු ගෙවීම සඳහා පමණක් වන බැවින් එහි MGEA සමඟ ජනන යැවීම (dispatch) සැසඳීම යථාර්ථවාදී නොවේ. මේ අනුව MGEA සහ තථ්‍ය කාලීන බලශක්ති යැවීම සමග සම්බන්ධයක් නොමැත. තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා ඒස් ඇඹිලිපිටිය බලාගාරයට අමතරව මෙහි සඳහන් ඒස් මාතර, හම්බන්තොට සහ ගාල්ල යන අතිරේක බලාගාර භාවිතා කර ඇති බව ද සඳහන් කළ යුතුය. එබැවින්, ඉහළ විචල්‍ය පිරිවැයක් සහිත ඒස් මාතර, හම්බන්තොට සහ ගාල්ල යන අතිරේක බලාගාරවලට වඩා මණ්ඩලය සෑම විටම අඩු වියදම් ඒස් ඇඹිලිපිටිය බලාගාරය භාවිතා කර ඇත. අවසාන වශයෙන්, රටේ විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා කුසලතා අනුපිළිවෙල මත සියලුම තාප බලාගාර භාවිතා කර ඇත.

අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කිරීම.

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 24 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කරන ලදි. | මෙගාවොට් 390 ක සම්පූර්ණ ධාරිතාවක් සඳහා NCRE ව්‍යාපෘතිවලින් බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ලංසු හතක් කැඳවා ඇත.<br><br>2013-08-06 න් පසු විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතු බව සඳහන් කිරීම නිවැරදි නොවේ. ඇත්ත වශයෙන්ම, 2009-04-08 (විදුලි පනත බලාත්මක කළ දිනය) සිට විදුලි බලශක්තිය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශයේ ශක්‍යතාව පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි භාවයක් පවතී. එබැවින්, විදුලි බලශක්තිය ලබා ගැනීම තරඟකාරී ලංසු තැබීම මත පදනම් විය යුතු බවට ගරු නීතිපතිවරයා සිය මතය (තෙවැනි වරටත්) ප්‍රකාශ කරන ලද 2017 ජූලි මස දක්වා ප්‍රමිතිගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත.<br><br>කෙසේ වෙතත් ලංසු 6 ක තත්ත්වය පහත පරිදි වේ.<br><br>• වවුනතිව්වල මෙගාවෝට්10 ක සූර්ය බලාගාරය: ලංසු 2017 සැප්තැම්බර් මස විවෘත කර ඇති අතර 2018 මැයි මාසයේදී අභිප්‍රාය ලිපිය (LOI) නිකුත් කර ඇත. සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා සුනීත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් හඳුනාගෙන ඇති ඉඩම සුරක්ෂිත කිරීමට සහ අදාළ පාර්ශවකරුවන්ගේ ආයතනවලින් අවශ්‍ය අවසර ලබා ගැනීමට සංවර්ධකයාට නොහැකි වීම හේතුවෙන්, විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම (PPA) පවා 2020.12.31 වන විට අත්සන් කිරීමට නොහැකි විය.<br>• පොලොන්නරුවේ මෙගාවෝට් 10 ක සූර්ය බලාගාරය: ලංසු 2017 පෙබරවාරි මස විවෘත කර ඇති අතර 2018 සැප්තැම්බර් මාසයේදී LOI අත්සන් කර ඇත. සංවර්ධන කටයුතු සඳහා SLSEA විසින් හඳුනාගෙන ඇති ඉඩම සුරක්ෂිත කිරීමට සහ අදාළ පාර්ශවකරුවන්ගේ | NCRE ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම. |

ආයතනවලින් අවශ්‍ය අවසර ලබා ගැනීමට සංවර්ධකයාට නොහැකි වීම හේතුවෙන් PPA 2020.12.31 වන විට අත්සන් කිරීමට නොහැකි විය.

- මෙගාවෝට් 1 * 90 සූර්ය බලාගාර ලංසුව : 2018 අප්‍රේල් මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම මත 2018 ඔක්තෝම්බර් සිට 2019 අගෝස්තු දක්වා කාලය තුළ සමාගම් 84 කට ලංසු ප්‍රදානය කරන ලදි. ලංසු බැඳුම්කර කල් ඉකුත්වීම සහ ලංසුකරුවන් විසින් ඒවා දීර්ඝ නොකිරීම හේතුවෙන් ලංසු 6 ක් සඳහා ලංසු ප්‍රදානය කිරීමට නොහැකි විය. ලංසු බැඳුම්කර 14 ක් අහිමි වීම හේතුවෙන් (ලංසු ප්‍රදානය කිරීම් 84 න්) ලංසු කරුවන් 70 කට පමණක් LOI නිකුත් කරන ලදි. 2020.12.31 වන විට ලංසු කරුවන් 35 ක් සමඟ PPAs අත්සන් කර ඇති අතර ඉතිරි සංවර්ධකයින්ට 2020.12.31 වන විට අවශ්‍ය නිෂ්කාශනයන් ඉදිරිපත් කිරීමට නොහැකි විය.
- කෘෂිකර්මය / ගොවිතැන සමඟ මෙගාවොට් 10 ක සූර්ය බලාගාරය : 2019 මැයි මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, ලංසු ප්‍රදානය 2020 ජුනි මාසයේදී සිදු කරන ලදි. 2020.12.31 ඇතුළත LOI අත්සන් කිරීමට අවශ්‍ය ලියකියවිලි සුරක්ෂිත කර ගැනීමට සංවර්ධකයාට නොහැකි විය.
- මෙගාවෝට් 1-10 පරාසයක යුත් මෙගාවොට් 60 සුළං බලාගාර : ග්‍රිඩ් උපපොළ පහ සඳහා 2020 මාර්තු මාසයේදී ලංසු විවෘත කරන ලදි. බෝලවත්ත සහ කප්පල්තුරේ ග්‍රිඩ් උපපොළ (GSS) සඳහා ලංසු ඉදිරිපත් නොකළ නිසා මෙගාවොට් 25 ක් ඉදිරිපත් නොවිය. ත්‍රිකුණාමලය GSS සඳහා මෙගාවොට් 10 ක් ප්‍රදානය කිරීමට කැබිනට් අනුමැතිය 2020.12.31 දින ලබා දෙන ලදි. මන්නාරම GSS සඳහා මෙගාවොට් 15 ක් ප්‍රදානය කිරීට 2020.12.31 දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියේය. මාදම්පේ GSS සඳහා මෙගාවොට් 10 ක් ලබා ගැනීමට 2020 නොවැම්බර් මාසයේදී නැවත ටෙන්ඩර්

| | | |
|---|---|---|
| | කරන ලද අතර 2020.12.31 දිනට ලංසුව අවසන් වීමට නියමිතව තිබුණි.<br>• මෙගාවෝට් 150 ක සූර්ය බලාගාර සඳහා ලංසුව (මෙගාවෝට් 1-10 පරාසයකින් යුත්) : ලංසු තැබීම 2020 ජූලි මාසයේදී අවසන් කරන ලදි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීම් අවසන් කර 2020 ඔක්තෝම්බර් වන විට SCAPC වෙත ඉදිරිපත් කරන ලදි. 2020.12.31 දක්වා අමාත්‍ය මණ්ඩලයෙන් කිසිදු තීරණයක් ලබා දී නොමැත.<br>2020 මාර්තු මාසයේ සිට Covid 19 වසංගතය රට තුළ ප්‍රථම වරට පැතිර ගිය අතර දෙවන රැල්ල 2020 ඔක්තෝම්බර් මාසයේදී ඇති වූ බව සඳහන් කළ යුතුය. මේ හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම් අවහිර වී ඇති අතර සියලු කටයුතු පාහේ ප්‍රමාද වීමට හේතු වී ඇත. | |
| (ආ) මෙගාවොට් 1 ක ධාරිතාවයකින් යුත් සූර්ය විදුලි බලාගාර 60 ක් ප්‍රසම්පාදනය සඳහා 2017 පෙබරවාරි 20 දින යෝජනා ඉල්ලීම් (ආර්.එෆ්.පී) කැඳවන ලදි. විදුලි බලාගාර 38 ක් සඳහා පමණක් ලංසු 65 ක් ලැබුණු අතර සාර්ථක ලංසුකරුවන් 36 දෙනා අතුරින් විදුලි බලාගාර 35 ක් සඳහා කිලෝවොට් පැයකට රු. 12.73 ක සිට කිලෝවොට් පැයකට රු. 18.37 ක් දක්වා වූ අනුපාත පරාසයක් යටතේ අභිප්‍රාය ලිපි නිකුත් කර තිබුණි. විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ කරන ලද දිනය 2020 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර දිනයක් වුවද 2020 දෙසැම්බර් 31 දිනට විදුලි බලාගාර 20 ක් පමණක් ක්‍රියාත්මක විය. | 2009-04-08 දින විදුලිබල පනත බලාත්මක කිරීමෙන් පසු තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා සූර්ය බලාගාර ප්‍රසම්පාදනය සඳහා මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද පළමු ටෙන්ඩරය මෙයයි. ඒ මත, කර්මාන්තයට අලුතින් පැමිණෙන රට පුරා සිටින කුඩා පරිමාණ ව්‍යාපෘති යෝජකයින්ගේ පුළුල් සහභාගීත්වය ලබා ගත හැකි වන පරිදි බලාගාරයක උපරිම ධාරිතාව මෙගාවොට් 1 කට සීමා කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයක් රජය විසින් ගෙන ඇත. එබැවින් මෙම ප්‍රයත්නය මණ්ඩලය සහ ව්‍යාපෘති යෝජකයන් යන දෙපාර්ශවයටම ඉගෙනීමේ ක්‍රියාවලියක් වී ඇත.<br>මීට අමතරව, 2018-02-08 දින LOI නිකුත් කිරීමෙන් පසු, ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතියට දැඩි ලෙස බලපෑ පහත සඳහන් Force Majeure තත්ත්වය රට තුළ ඇති විය.<br>1. 2018 නොවැම්බර් සිට 2019 ජනවාරි දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය නොතිබුණි.<br>2. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය 2019 අවසානය දක්වා රටම අඩපණ කළේය.<br>3. 2020 ආරම්භයේ සිට ගෝලීය වශයෙන් Covid-19 වසංගතයේ රැලි කිහිපයක් වරින් වර ආරම්භ වීම සහ පසුව 2020 මාර්තු සිට 2021 ජුනි දක්වා දේශීයව අගුලු දැමීමේ ක්‍රියා පටිපාටි හඳුන්වා දීම. | බලාගාර ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම. |

| | | |
|---|---|---|
| | එබැවින්, තත්ත්වයන් පිළිබඳව මනාව තක්සේරු කිරීමත් සමඟ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021-06-30 දින දක්වා වාණිජ මෙහෙයුම් දිනයට අදාළ කාල රාමුවට දීර්ඝ කිරීම් දැනටමත් ලබා දී ඇත. 2021-06-30 දිනට ව්‍යාපෘති 27 ක් ක්‍රියාත්මක කර ඇති අතර එය ඉහත සඳහන් කළ තත්ත්වයන් මධ්‍යයේ විශිෂ්ට ජයග්‍රහණයක් විය. | |
| (ඇ) 2020 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය (avoided cost method) මත කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 19.51 ක් සහ වියළි කාලය සඳහා රු. 21.25 ක් විය. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. එම නිසා, එම ක්‍රමය මත තීරණය වූ ගාස්තුව කුඩා ජල විදුලි බලාගාරයක තථ්‍ය පිරිවැයට කිසිදු සම්බන්ධයක් නොමැත. ජල විදුලි බලාගාරයක සාමාන්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතු බව සහ මණ්ඩලයේ ජල විදුලි බලාගාරයක ඒකකයක පිරිවැය රු.2.49 ක් බව නිරීක්ෂණය විය. තවද, එය සාමාන්‍ය ඒකක විකුණුම් මිල වන රු. 16.72 ඉක්මවා ඇත. | NCRE බලාගාර සංවර්ධනයේ නැගී එන ක්ෂේත්‍රය සඳහා ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය ආරම්භයේදී හඳුන්වා දෙන ලදි. අනතුරුව, මෙම ක්‍රමයේ අඩුපාඩු හඳුනාගෙන 2008 වර්ෂයේදී 'පිරිවැය පදනම්කරගත්, තාක්ෂණ විශේෂී, ත්‍රිත්ව ස්ථර අයක්‍රමය' ලෙස නව ගාස්තු ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. පසුව, මෙම ක්‍රමයද තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියකට වෙනස් කරන ලද අතර එහිදී වෙළඳපල බලවේග විසින් ගාස්තු තීරණය කරන ලදි. | වළකාලන ලද පිරිවැය ක්‍රමය යටතේ දැනට ක්‍රියාත්මක වන කුඩා ජලවිදුලි බලාගාර සඳහා භාවිතා කරන ක්‍රමය හෝ ගාස්තුව වෙනස් කිරීමේ හැකියාව සමාලෝචනය කිරීම. |
| (ඈ) සූර්ය විදුලි බලාගාර සඳහා රු. 23.10 ක ස්ථාවර අනුපාතයක්, ප්‍රමිත ගාස්තුවක් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් 2014 මාර්තු 07 දින අනුමත කරන ලදි. සංශෝධිත 2009 අංක 20 දරන විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තීරණය කරන ලද මිල ගණන් භාවිතා කිරීම වෙනුවට 2016 සහ 2017 දී එම ප්‍රමිත ගාස්තු යටතේ මෙගාවොට් 10 බැගින් වූ | 2009-04-08 සිට විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු තැබීම නියම කර ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් කර්මාන්තය තුළ පවතින නොපැහැදිලි තත්ත්වයන් හේතුවෙන්, 2017 දක්වා ප්‍රමිතිගත ගාස්තු භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. | සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම. |

| | | |
|---|---|---|
| ධාරිතාවයෙන් යුත් සූර්ය විදුලි බලාගාර පහක් ක්‍රියාත්මක විය. (විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම් 2014 දී අත්සන් කරන ලදි). නව සූර්ය විදුලි බලාගාර සඳහා (1මෙ.වො x 60) 2017 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රසම්පාදනයන්හිදී තීරණය කරන ලද මිල ගණන් රු. 12.73 සිට රු. 18.37 දක්වා වූ පරාසයක පැවතුණු බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තීරණය කරන ලද මිල ගණන් භාවිතා කිරීම වෙනුවට 2013 අගෝස්තු 6 න් පසුව ක්‍රියාත්මක කරන ලද එකතුව මෙගාවොට් 135.62 ක ධාරිතාවයකින් යුත් ජෛව ගැස් විදුලි බලාගාර, දැව තාප විදුලි බලාගාර, කුඩා ජල විදුලි බලාගාර සහ සුළං විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා 2014 මාර්තු 07 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රමිත ගාස්තු යොදා ගෙන තිබුණි. (විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම් 2013 අගෝස්තු 6 න් පසුව අත්සන් කරන ලදි). | 2013-08-06 න් පසු විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතු බව සඳහන් කිරීම නිවැරදි නොවේ. ඇත්ත වශයෙන්ම, 2009-04-08 (විදුලි පනත බලාත්මක කළ දිනය) සිට විදුලි බලශක්තිය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශයේ ශක්‍යතාව පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි භාවයක් පවතී. එබැවින්, විදුලි බලශක්තිය ලබා ගැනීම තරඟකාරී ලංසු තැබීම මත පදනම් විය යුතු බවට ගරු නීතිපතිවරයා සිය මතය (තෙවැනි වරටත්) ප්‍රකාශ කරන ලද 2017 ජූලි මස දක්වා ප්‍රමිතිගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. | සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම. |
| (ඊ) 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළ යුතුව තිබියෙදී. කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයක් 2020 දෙසැම්බර් මාසයේදී විදුලි පද්ධතියට සම්බන්ධ කර තිබුණි. කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. | 2013-08-06 න් පසු විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතු බව සඳහන් කිරීම නිවැරදි නොවේ. ඇත්ත වශයෙන්ම, 2009-04-08 (විදුලි පනත බලාත්මක කළ දිනය) සිට විදුලි බලශක්තිය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශයේ ශක්‍යතාව පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි භාවයක් පවතී. එබැවින්, විදුලි බලශක්තිය ලබා ගැනීම තරඟකාරී ලංසු තැබීම මත පදනම් විය යුතු බවට ගරු නීතිපතිවරයා සිය මතය (තෙවැනි වරටත්) ප්‍රකාශ කරන ලද 2017 ජූලි මස දක්වා ප්‍රමිතිගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. | සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම. |

| | | |
|---|---|---|
| 36.20 ක් මණ්ඩලය දරනු ලබන අතර අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එයින් රු.13.10 ක් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය. | මීට අමතරව, කොළඹ අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ (මහ නගර) විදුලිබල ව්‍යාපෘතිය සහ තුම්බෝව්ල කරදියාන අපද්‍රව්‍ය (මහ නගර) විදුලිබල ව්‍යාපෘතිය සඳහා PPAs අත්සන් කිරීම සඳහා පිළිවෙලින් 2017-10-10 සහ 2019-02-12 දිනැති කැබිනට් තීරණවලට මණ්ඩලය විසින් අනුකූලව කටයුතු කර ඇත.<br><br>වෙස්ටර්න් පවර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවා ඇති ගාස්තුවල ඉතිරි කොටස ප්‍රතිපූරණය සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉන්වොයිස් කර ඇත. | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය (SORP) දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ට සහ කණිෂ්ඨ විධායකයින්ට සම්බන්ධ SORP වෙළුම් දෙකක් දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා SORP සමාලෝචනයට භාජනය කර ඇති අතර එම අරමුණු සඳහා පත් කරන ලද කමිටුව විසින් සමාලෝචනය අවසන් කළ පසු ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. | SORP සංවර්ධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර වුවද, එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා නොමැති අතර තනතුරු වෙනත් සේවාවන් සඳහා විවෘතව තබා ඇත. (විශේෂයෙන්, විදුලි ඉංජිනේරුවන් සඳහා.) | ප්‍රධාන තනතුරු සඳහා සපුරාලීමට අවශ්‍ය අධ්‍යයන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් ඇතුළත් වේ. තවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්), මානව සම්පත් හෝ ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රවල පශ්චාත් උපාධියක් ඇති I වන පන්තියේ විදුලි ඉංජිනේරුවන්ගෙන් තෝරා ගනු ලබයි. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයේ හි දෙපාර්තමේන්තු ප්‍රධානියා සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළත් කිරීම. |
| (ඇ) පවත්නා SORP ට අනුව, මානව සම්පත් නිලධාරීන්ගේ (HRO) සමස්ත කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරින් පුරවන අතර එම ප්‍රතිශතය වසරින් වසර ක්‍රමයෙන් සියයට 85 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, මණ්ඩලයේ ඉතිහාසයේ දීර්ඝ කාලයක් පුරා ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ කාර්යයන් | ලබා දී ඇති නිර්දේශය සපුරාලීම සඳහා, මේ මොහොතේ සාකච්ඡාවට භාජනය වන මණ්ඩලයෙහි ප්‍රධාන ව්‍යුහාත්මක වෙනසක් සිදු කළ යුතුය. | SORP තුළ බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි උසස්වීම් ලබාගැනීමේ මාර්ගයක් ඇතුළත් කිරීම. |

| | | |
|---|---|---|
| ඉංජිනේරුවන් දෙදෙනෙකු විසින් ආවරණය කරන ලද බැවින් උසස්වීම් යෝජනා ක්‍රමයෙහි බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි උසස්වීම් මාර්ගයක් නිරීක්ෂණය නොවීය. | | |
| (ඇ) මානව සම්පත් කළමනාකරු (HRM) සහ මානව සම්පත් නිලධාරි (HRO) සෘජුවම බඳවා ගැනීම සඳහා අවශ්‍ය පළපුරුද්ද වන්නේ සේවකයින් 100 කට වැඩි සංඛ්‍යාවක් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර 06 කි. මණ්ඩලය තුළ හැසිරවීමට අවශ්‍ය කාර්ය මණ්ඩල ශක්තියට සාපේක්ෂව ඉහත පළපුරුද්ද ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | ලබා දී ඇති නිර්දේශය මේ වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇති ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ නව SORP හි ඇතුළත් කර ඇත. | සංශෝධිත SORP සඳහා වහාම අනුමැතිය ලබා ගැනීම. |
| (ඉ) නීති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර වන ප්‍රධාන නීති නිලධාරී තනතුර 2014 ජුනි 04 සිට පුරප්පාඩු වී ඇත. | බාහිර බඳවා ගැනීමේ පදනම මත සුදුසු ප්‍රධාන නීති නිලධාරියකු බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර මේ වන විට අදාළ කටයුතු සිදුකරමින් පවතී. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායී හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (ඊ) වැදගත් හා රහස්‍ය තනතුරක් වන අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුර 2016 ජුලි 08 සිට පුරප්පාඩු වී ඇති අතර මණ්ඩලය විසින් මෙම පුරප්පාඩුව පිරවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සෘජුවම වගකිව යුතුය. කෙසේවෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලයට ලේකම්වරයකු බාහිරව බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවසර ලබා දී නොමැත. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායී හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (උ) 2017 මැයි 29 දින සිට ව්‍යාපෘති කළමණාකරු (ඊ.ආර්.පී) තනතුර වසර 3 කට වැඩි කාලයක් පුරප්පාඩු වී ඇති අතර එම තනතුරේ වැඩ බැලීම බස්නාහිර පළාත, දකුණ 1 හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා විසින් සිදු කරයි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ (ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය) තනතුර 2017 වර්ෂයේදී මණ්ඩලය අභ්‍යන්තරව ප්‍රචාරය කරන ලදි. කෙසේ වෙතත්, තනතුර සඳහා අදාළ අයදුම්පත් ලැබී නොමැත. එබැවින්, බස්නාහිර පළාත, දකුණු 1 හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව 2017 මැයි 29 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂ (ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය) තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා මාස හයක කාලයක් සඳහා ජී.ඒ.ඩී.ආර්.පී සෙනෙවිරත්න මහතාව මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් පත් කර තිබේ. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායී හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| | KPMG ශ්‍රී ලංකා සමාගම තරඟකාරී ටෙන්ඩරයක් මත ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් ලෙස තෝරා ගැනීමෙන් පසුව ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) ව්‍යාපෘතියේ සැලසුම් අදියර 2017 ජූනි මාසයේදී ආරම්භ කරන ලදි. ව්‍යාපෘතියේ සැලසුම් අවධියේදී, ක්‍රියාකාරී අවශ්‍යතා පිරිවිතර, ක්‍රියාකාරී නොවන අවශ්‍යතා පිරිවිතර, RFP ලේඛන සකස් කිරීම සිදු කරන ලදි. ව්‍යාපෘතියේ සැලසුම් අවධියේදී ERP පද්ධතිය සැලසුම් කිරීම සඳහා මණ්ඩලයේ වෘත්තිකයන් 1800 ක් වැඩමුළු 80 කට සහභාගී විය. මෙහෙයුම් කමිටු රැස්වීම් 07 ක් සහ වෙනත් රැස්වීම් 65 ක් ද ඉහත කාල සීමාව තුළ පැවැත්විණි. පසුව ව්‍යාපෘති කණ්ඩායම ආසියානු සංවර්ධන බැංකුව හරහා ව්‍යාපෘතිය සඳහා සහනදායී මූල්‍ය පහසුකම් ලබා ගැනීමට සමත් විය. පසුව ටෙන්ඩර් පටිපාටිය ආරම්භ කළ අතර තවමත් ටෙන්ඩර් කටයුතු සිදුවෙමින් පවතී.<br>ERP පද්ධතියක් සංවර්ධනය කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය අවශ්‍ය වේ. ERP පද්ධතියක් සාර්ථකව නිම කිරීම සඳහා ඉහළ කළමනාකාරීත්වයේ නායකත්වය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයකි.<br>ඉහත කරුණු පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම සහ එම ව්‍යාපෘතියේ ප්‍රගතිය තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂ (ERP) තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා GADRP සෙනෙවිරත්න මහතා වෙත පවරා ඇති කාලය දීර්ඝ කර ඇත. | |
| (ඌ) වත්කම් කළමනාකරණ අංශය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව යෙදවීම වෙනුවට අනෙකුත් අංශවල මානව සම්පත් හිඟයක් පවතින විට කළමනාකරණ අකාර්යක්ෂමතාව හඟවමින් 2020 දෙසැම්බර් 31 දිනට අමතර සේවකයන් 28 ක් තනතුරු 04 කට අනුයුක්ත කර තිබුණි. | 2018 පුද්ගල සැලැස්මේ තාක්ෂණික සහකරුවන් 13 ක් 2018-2020 කාලය තුළ පුහුණු තාක්ෂණික සහකරුවන් ලෙස උසස් කර ඇත. මෙම අභ්‍යන්තර උසස් කිරීම් හේතුවෙන් 2020-12-31 දිනට පුහුණු තාක්ෂණික සහකරුවන් සංඛ්‍යාව වැඩි විය. උසස් කරන ලද පුහුණු තාක්ෂණික සහකරුවන් ඔවුන්ගේ වත්මන් සේවා ස්ථානවල සමාන ආකාරයේ වැඩ කරමින් සිටී. මෙම අභ්‍යන්තර උසස්වීම් හේතුවෙන් 2020-12-31 දිනට තාක්ෂණික සහකරුවන් සංඛ්‍යාව 2018 පුද්ගල සැලැස්මට වඩා අඩු විය.<br>මණ්ඩලයේ වොලිබෝල් කණ්ඩායමේ සිටින | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| | සේවකයින් 08 දෙනෙකු 2020 දී පුද්ගල ශාඛාවෙන් AM අංශයේ ආරක්ෂක ඒකකයට මාරු කර යවා ඇත. ඔවුන් කාර්යාල සේවක කාණ්ඩයට අයත් වන අතර මෙම ස්ථාන මාරුව හේතුවෙන් AM අංශයේ කාර්යාල සේවකයන්ගේ සංඛ්‍යාව 2020 දී වැඩි වී ඇත. AM අංශයට මාරු කරන ලද දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන් 5 දෙනා AM අංශයේ පුරප්පාඩු වූ පරිපාලන සම්බන්ධීකාරක සහ යතුරු ලියනයක තනතුරුවල රාජකාරි ආවරණය කරයි. | |
| (එ) බෙදාහැරීමේ අංශ 01, 02 සහ 04 හි තනතුරු 35 සඳහා අතිරික්ත සේවකයින් 1050 ක් අනුයුක්ත කර ඇති බව නිරීක්ෂණය වූ අතර අනෙකුත් අංශවල එම තනතුරුවල හිඟයන් පැවතීම හේතුවෙන් විධිමත් හා ඵලදායී ලෙස සේවකයින් යෙදවීම සිදු වී නොමැත. | අදාළ අංශ මගින් කරුණු විශ්ලේෂණය කර සමාලෝචනය කරනු ලැබේ. ඒ අනුව සේවක හිඟය හඳුනාගෙන ඇති ස්ථාන සඳහා අතිරික්ත කාර්ය මණ්ඩලය යොදවනු ඇත. අදාළ රැකියා කාණ්ඩ පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයකින් පසුව මෙය සිදු කරනු ලැබේ. | මෙම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |